# වසර මැද

# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

# 2023

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,

ශ්‍රී ලංකාව

# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ
10 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

රනිල් වික්‍රමසිංහ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය
2023 ජූනි 30

# වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2023

## 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් අදාළ වසරේ ජූනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2023 වසරේ පළමු මාස හතර තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2023 පළමු මාස හතර සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01 වන පරිච්ඡේදය | **ආර්ථික සන්දර්භය** | 09 |
| | සමාලෝචනය | 09 |
| | උද්ධමනය | 10 |
| | මුදල් හා ණය | 11 |
| | කොටස් වෙළෙඳපොළ | 11 |
| | විදේශ අංශයේ ප්‍රවණතා | 12 |
| | ගෝලීය ආර්ථික ප්‍රවණතා | 15 |
| 02 වන පරිච්ඡේදය | **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා** | 21 |
| | සමාලෝචනය | 21 |
| | රාජ්‍ය ආදායම | 24 |
| | රාජ්‍ය වියදම | 34 |
| | භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය | 39 |
| 3 වන පරිච්ඡේදය | **රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය** | 43 |
| | සමාලෝචනය | 43 |
| | රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය | 43 |
| | රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්වල ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර | 47 |
| 4 වන පරිච්ඡේදය | **විදේශ මූල්‍යයනය** | 51 |
| | සමාලෝචනය | 51 |
| | විදේශ මූල්‍යයන එකඟතා | 51 |
| | විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජන | 51 |
| | එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය | 52 |
| | විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය | 53 |

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම 2022 | වටිනාකම 2023 (තාවකාලික) |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | -0.5 | -11.5 |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තුව | % | -4.4 | 0.8 |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | -3.7 | -23.4 |
| සේවා | පළමු කාර්තුව | % | 1.8 | -5.0 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | මැයි අවසානයට | % | 39.1 (2013=100) | 25.2 (2021=100) |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 4.7 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 49.8 | ලැ.නො. |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන.-අප්‍රේල් | රු.මිලි. | -524,100 | -824,256 |
| මුළු ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 630,908 | 820,070 |
| බදු ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 543,649 | 742,578 |
| බදු නොවන ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 87,259 | 77,493 |
| වර්තන වියදම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 1,016,810 | 1,484,984 |
| රාජ්‍ය ආයෝජන | ජන.-අප්‍රේල් | රු.මිලි. | 140,999 | 177,903 |
| රාජ්‍ය ණය | දෙසැ.අවසානයට | රු.බිලි. | 27,492 | ලැ.නො. |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 5,273 | 4,866 |
| එයින් කෘෂි අපනයන | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 975 | 1,018 |
| කාර්මික අපනයන | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 4,277 | 3,825 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 2,409 | 2,031 |
| වෙනත් | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 1,868 | 1,794 |
| ආනයන | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 8,802 | 6,791 |
| පාරිභෝගික භාණ්ඩ | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 1,354 | 1,242 |
| අන්තර් භාණ්ඩ | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 5,843 | 4,571 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 2,384 | 2,065 |
| ආයෝජන භාණ්ඩ | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 1,603 | 971 |
| වෙළඳ ශේෂය | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | -3,528 | -1,926 |
| සංචාරක පැමිණීම් | ජන.-මැයි | සංඛ්‍යාව | 378,521 | 524,486 |
| සංචාරක ඉපැයීම් | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 635 | 828 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 1,336 | 2,347 |
| කොටස් වෙළඳපොල විවිධ අයෝජන(ශුද්ධ) | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 92 | 3 |
| සමස්ත ගෙවුම් ශේෂය | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | -2,595 | 1,597 |
| දළ නිල සංචිත | මැයි අවසානය | ඇ.ඩො.මිලි. | 1,887 | 3,491 |
| විනිමය අනුපාතය (මාසය අග) | මැයි අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 360.8 | 295.5 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන.-මැයි | ඇ.ඩොලරයට රුපියල් | 358.9 | 310.2 |
| **මුදල් අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 13.5 | 15.5 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 14.5 | 16.5 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | මැයි අවසානය | % | 4.0 | 4.0 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | මැයි අවසානය | % | 22.1 | 20.3 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ණය අනුපාතය | මැයි අවසානය | % | 13.5 | 17.8 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 01) | මැයි අවසානය | % | - | - |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | මැයි අවසානය | % | 23.7 | 25.7 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | මැයි අවසානය | % | 24.3 | 22.9 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_2b$) | මැයි 2023/ මැයි 2022 | % | 20.0 | 3.7 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | මැයි 2023/ මැයි 2022 | % | 20.3 | -8.3 |

## ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| **විදුලි බලය** | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2022 | % | 99.3 |
| **ජලය** | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2022 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 96.0 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2022 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 60.4 |
| **මාර්ග** | | | |
| මාර්ග ඝනත්වය | 2022 | වර්ග කි.මී. | 2.21 |
| මාර්ග වල මුළු දිග | 2022 | කි.මී | 144,937 |
| **සන්නිවේදනය** | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2022 | පුද්ගලයින් 100 කට | 142 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2022 | පුද්ගලයින් 100 කට | 97.7 |
| **අධ්‍යාපනය** | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2022 | % | 95.3 |
| ශිෂ්‍ය/ගුරු අනුපාතය (රජයේ පාසැල්) | 2022 | සංඛ්‍යාව | 16.8 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2021 | % | 93.3 |
| පරිගණක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 6) | 2022 | % | 35.7 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ශිෂ්‍ය/ගුරු අනුපාතය | 2022 | සංඛ්‍යාව | 20.2 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23) (අ) | 2022 | % | 9.3 |
| **සෞඛ්‍ය** | | | |
| රෝහල් (බටහිර වෛද්‍ය) (ආ) | 2022 | සංඛ්‍යාව | 617 |
| ඇඳන් (ආ) | 2022 | සංඛ්‍යාව | 78,228 |
| රෝහල් ඇඳන් | 2022 | පුද්ගලයින් 1,000 කට | 3.5 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2022 | සංඛ්‍යාව | 1,054 |
| **ජනගහනය** | | | |
| ජනගහන ඝනත්වය | 2022 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 354 |
| ජනගහන වර්ධනය | 2022 | % | 0.1 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2017 | අවුරුදු | 75.5 |
| ළදරු මරණ අනුපාතිකය | 2019 | සජීවී උපත් 1,000 කට | 7.4 |
| මාතෘ මරණ අනුපාතිකය | 2015 | සජීවී උපත් 1,000 කට | 23.2 |
| දළ උපත් අනුපාතිකය | 2022 | පුද්ගලයින් 1,000 කට | 12.4 |
| දළ මරණ අනුපාතිකය | 2022 | පුද්ගලයින් 1,000 කට | 8.1 |
| යැපුම් අනුපාතිකය | 2022 | % | 49.4 |
| **දරිද්‍රතාව** | | | |
| දරිද්‍රතා දර්ශකය | 2019 | % | 14.3 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2019 | සංගුණකය | 0.46 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2019 | % | 2.8 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2019 | කිලෝකැලරි | 2,120 |
| **ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම්** | | | **ස්ථානය** |
| මානව සංවර්ධන දර්ශකය | 2021 | රටවල් 189 ක් අතරින් ස්ථානය | 73 |
| ව්‍යාපාර පවත්වා ගෙන යාමේ දර්ශකය | 2020 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 101 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2019 | රටවල් 141 ක් අතරින් ස්ථානය | 84 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2022 | රටවල් 176 ක් අතරින් ස්ථානය | 136 |
| ගෝලීය සාම දර්ශකය | 2022 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 90 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2022 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 95 |

(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.

(ආ) රජයේ

# 1 වන පරිච්ඡේදය

# ආර්ථික සන්දර්භය

## සමාලෝචනය

රාජ්‍ය මූල්‍ය, මුදල්, මූල්‍ය හා විදේශ අංශ ආවරණය කරමින් රජය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රබල ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සමඟ, ආර්ථික ස්ථායීකරණය කරා යන මාවතක් වෙත ශ්‍රී ලංකාව ක්‍රමයෙන් අවතීර්ණ වෙමින් සිටියි. උද්ධමනකාරී පීඩනයන් අඩු වීම, ශ්‍රමික ප්‍රේෂණ හා සංචාරක ඉපැයීම් තුළින් විදේශ විනිමය ගලා ඒම් ඉහළ යාම, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, විදේශ විනිමය සංචිත ඉහළ යාම, සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා දිගු පෝලිම්, විදුලිය විසන්ධි කිරීම්, සහ සමාජයීය හා දේශපාලනික අසහනය ඇතුළු 2022 වසරේ දී දක්නට ලැබුණු අයහපත් ආර්ථික තත්ත්වයන් ක්‍රමයෙන් සමනය වීම සමඟ ආර්ථිකයේ ධනාත්මක ලක්ෂණ පැහැදිලි වෙමින් පවතියි.

ආර්ථිකයේ සියලු අංශ ආවරණය කරනු ලබන පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සමඟ විශේෂ ගැණුම් හිමිකම් බිලියන 2.286 ක (ඇ.ඩො. බිලියන 3 ක පමණ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමක් යටතේ වන මාස 48 ක වැඩපිළිවෙළක් ශ්‍රී ලංකාව දැනට ක්‍රියාත්මක කරමින් සිටියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සමඟ සංවර්ධන පාර්ශ්වකරුවන් සිය සහාය ලංකාවට ලබා දී ඇති අතර, ඒ අතරින් ආසියානු සංවර්ධන බැංකුව ආර්ථික ස්ථායීකරණය සඳහා ශ්‍රී ලංකාවට අයවැය සහාය ලබා දීමට ඇ.ඩො. මිලියන 350 ක් විශේෂ ප්‍රතිපත්ති පාදක ණයක් හා හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පවතින අවස්ථා පුළුල් කිරීම සඳහා සහනදායී මූල්‍යකරණය ලබා ගැනීමට ඇති සුදුසුකම ද අනුමත කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකාවට අයවැය හා සුභසාධන සහාය ලෙස ඇ. ඩො. මිලියන 700 ක් ලෝක බැංකුව විසින් අනුමත කරන ලදී.

කෙසේ වුවද, ආර්ථික ස්ථායීකරණය කරා යන මාවතෙහි අභියෝග රැසක් පවතියි. 2023 වසරේ පළමු කාර්තුවෙහි ආර්ථිකයේ සියයට 11.5 ක සංකෝචනයක් වාර්තා විය. කෙසේ වුවද, 2022 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.4 සංකෝචනයට සාපේක්ෂව, 2023 වසරේ එම කාර්තුවේ දී සියයට 0.8 ක වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ කෘෂිකර්ම අංශය යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කරමින් සිටියි. 'වී වගා කිරීම' සියයට 42.1 කින් වර්ධනය වී ඇති අතර, 'මිරිදිය ධීවර කටයුතු' හා 'ධාන්‍ය වගා කිරීම' පිළිවෙළින් සියයට 16.9 කින් හා සියයට 13.0 කින් වැඩි වී ඇත. කෙසේ වුවද, සමස්ත කර්මාන්ත කටයුතු 2022 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 3.7 ක සංකෝචනයට සාපේක්ෂව, 2023 වසරේ පළමු කාර්තුවේ දී සියයට 23.4 කින් සංකෝචනය විය. 'පතල් හා කැණීම්' කර්මාන්තය සියයට 45.7 කින් ද, 'ඉදිකිරීම්' කර්මාන්තය සියයට 38.3 කින් ද, සමස්ත නිමැවුම් කර්මාන්තය සියයට 14.2 කින් සංකෝචනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. ගෝලීය ඉල්ලුම අඩු වීම, ආනයන නිමැවුම් අංශයට, විශේෂයෙන්ම ඇඟළුම් අංශයට අභියෝගයක් විය හැක. 2022 වසරේ පළමු කාර්තුවේ සියයට 1.8 ක වර්ධනයට සාපේක්ෂව, සේවා අංශය 2023 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.0 ක සංකෝචනයක් වාර්තා විය. 'රක්ෂණ සේවා' හා 'මූල්‍ය සේවා' පිළිවෙළින් සියයට 38.3 හා සියයට 33.2 කින් සංකෝචනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසරේ සැප්තැම්බර් මස වාර්තා වූ සියයට 70 ක (2013=100) පමණ ඉහළම අගයක සිට 2023 ජූනි මස සියයට 12.0 දක්වා අඩු වීම සමඟ මේ වසර මුළුල්ලේම උද්ධමනය අඩු වී ඇත. 2023 වසරේ ජූනි මස දී ආහාර උද්ධමනය ද සියයට 4.1 දක්වා අඩු විය. උද්ධමනයේ වේගවත් අඩු වීම හා 2023 වසරේ තුන්වන කාර්තුව වන විට තනි අගයක් දක්වා තවදුරටත් අපේක්ෂිත අඩු වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසරේ ජූනි මස 01 වන දින සිට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින් සියයට 13.00 සහ සියයට 14.00 දක්වා පදනම් අංක 250 කින් අඩු කරන ලදී.

2022 වසරේදී මුහුණ පෑ පෙර නොවූ විරූ අභියෝගවලට පසු විදේශ අංශය 2023 වසරේ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී. වෙළඳ හිඟය 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. බිලියන 3.5 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී ඇ. ඩො. බිලියන 1.9 ක් දක්වා අඩු විය. 2023 වසරේ පළමු මාස පහ තුළ අපනයන ආදායම ඇ. ඩො. බිලියන 4.9 ක් ලෙස වාර්තා වූ අතර, එය 2022 වසරේ දී සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ ඇ. ඩො. බිලියන 5.3 ට සාපේක්ෂව සියයට 7.7 ක අඩුවීමකි. එම කාලය තුළ රෙදිපිළි සහ ඇඟලුම් අපනයනය, ඛනිජ තෙල් නිෂ්පාදන සහ රබර් නිෂ්පාදන අපනයනය පහත වැටී ඇති අතර, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ

සහ තේ අපනයන ආදායම වැඩිවීම වෙළෙඳ ශේෂයේ ධනාත්මක ප්‍රතිඵල සඳහා වැඩි දායකත්වයක් ලබා දී ඇත. ආනයන වියදම 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. බිලියන 8.8 ට සාපේක්ෂව, 2023 වසරේ ඇ. ඩො. බිලියන 6.8 ක් දක්වා සියයට 22.8 කින් සැළකිය යුතු ලෙස අඩු විය. රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ඉන්ධන, ගොඩනැගිලි ද්‍රව්‍ය, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ ධාන්‍ය වර්ග මෙන්ම ඇඹරුම් කර්මාන්තය නිෂ්පාදන ආනයන පහළ යාම මේ සඳහා මූලික වශයෙන් හේතු වී ඇත.

සේවක ප්‍රේෂණ 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. බිලියන 1.3 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ ඇ. ඩො. බිලියන 2.3 ක් දක්වා සියයට 75.7 කින් ඉහළ යන ලදී. සංචාරක ඉපැයීම් ද 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 634.6 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 827.8 ක් දක්වා සියයට 30.4 කින් වැඩි විය. සංචාරක පැමිණීම් පසුගිය වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ 378,521 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී 524,486 දක්වා සියයට 38.6 කින් ඉහළ යන ලදී.

විදේශ මුදල් ගලා ඒම වර්ධනය වීමත් සමඟම, චීන මහජන බැංකුවෙන් ලබාගත් ණය හුවමාරු පහසුකම ද ඇතුලත්ව දළ නිල සංචිත ඇ. ඩො. බිලියන 3.5 දක්වා අඛණ්ඩව ඉහළ යන ලදී. විදේශ අංශයේ ධනාත්මක වර්ධනයත් සමඟ 2023 වසරේ ජූනි මස 28 දින වන විට රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 17.6 කින් අධිප්‍රමාණය වී ඇත.

## උද්ධමනය

2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉතා ඉහළ මට්ටමක පැවති මතුපිට උද්ධමනය ඉන් අනතුරුව අඩුවීමේ ප්‍රවණතාවයක් දක්වන ලදී. දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්ගේ පසු බලපෑම, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, ගෑස් හා ඉන්ධන මිළ අඩු වීම, ආහාර මිළ ගණන් සාමාන්‍යකරණය වීම හා සංඛ්‍යානමය පදනම් වර්ෂයේ හිතකර බලපෑම යනාදිය හේතුවෙන්, 2023 වසරේ පළමු මාස පහ තුළ මතුපිට උද්ධමනය අඩු වීමේ ප්‍රවණතාවය අපේක්ෂා කළ ආකාරයට වඩා වේගයෙන් සිදු විය.

ඒ අනුව, ආහාර හා අහාර නොවන කාණ්ඩයන්ගේ මිල අඩුවීම පිළිබිඹු කරමින් ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය

**1.1 වගුව : උද්ධමනයේ විචලනය (%)**

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිළ දර්ශකය | | | | ජාතික පාරිභෝගික මිළ දර්ශකය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය |
| 2022** | ජනවාරි | 14.2 | 6.9 | 9.9 | 5.0 | 16.8 | 8.1 | 12.9 | 6.2 |
| | පෙබරවාරි | 15.1 | 7.9 | 10.9 | 5.7 | 17.5 | 9.3 | 14.1 | 7.1 |
| | මාර්තු | 18.7 | 9.1 | 13.0 | 6.5 | 21.5 | 10.6 | 17.3 | 8.2 |
| | අප්‍රේල් | 29.8 | 11.3 | 22.0 | 8.1 | 33.8 | 13.0 | 27.9 | 10.2 |
| | මැයි | 39.1 | 14.2 | 28.4 | 10.2 | 45.3 | 16.3 | 37.7 | 13.0 |
| | ජූනි | 54.6 | 18.4 | 39.9 | 13.3 | 58.9 | 20.8 | 49.3 | 16.8 |
| | ජූලි | 60.8 | 23.1 | 44.3 | 16.7 | 66.7 | 25.9 | 57.3 | 21.3 |
| | අගෝස්තු | 64.3 | 28.0 | 46.6 | 20.3 | 70.2 | 31.3 | 60.5 | 26.0 |
| | සැප්තැම්බර් | 69.8 | 33.4 | 50.2 | 24.1 | 73.7 | 36.9 | 64.1 | 31.0 |
| | ඔක්තෝබර් | 66.0 | 38.3 | 49.7 | 27.8 | 70.6 | 42.2 | 62.4 | 35.7 |
| | නොවැම්බර් | 61.0 | 42.6 | 49.4 | 31.4 | 65.0 | 46.7 | 60.1 | 40.0 |
| | දෙසැම්බර් | 57.2 | 46.4 | 47.7 | 34.6 | 59.2 | 50.4 | 57.5 | 43.9 |
| 2023*** | ජනවාරි | 51.7 | ලැ.නො | 45.6 | ලැ.නො | 53.2 | ලැ.නො | 52.0 | ලැ.නො |
| | පෙබරවාරි | 50.6 | ලැ.නො | 43.6 | ලැ.නො | 53.6 | ලැ.නො | 50.1 | ලැ.නො |
| | මාර්තු | 50.3 | ලැ.නො | 39.1 | ලැ.නො | 49.2 | ලැ.නො | 44.2 | ලැ.නො |
| | අප්‍රේල් | 35.3 | ලැ.නො | 27.8 | ලැ.නො | 33.6 | ලැ.නො | 31.8 | ලැ.නො |
| | මැයි | 25.2 | ලැ.නො | 20.3 | ලැ.නො | 22.1 | ලැ.නො | 21.6 | ලැ.නො |
| | ජූනි | 12.0 | ලැ.නො | 9.8 | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො | ලැ.නො |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

*කො.පා.මි.ද. මූලික උද්ධමනය, ජා.පා.මි.ද. මූලික උද්ධමනය - ආහාර, බලශක්ති, ප්‍රවාහන යන නිතර වෙනස්වන අයිතමයන් හැර

** පදනම් වර්ෂය *2013=100*

*** පදනම් වර්ෂය *2021=100*

වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 53.2 සිට 2023 වසරේ මැයි මාසයේ දී සියයට 22.1 දක්වා අඩු විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 51.7 සිට 2023 වසරේ ජූනි මාසයේ දී සියයට 12.0 දක්වා අඩු විය. ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය ද, 2023 වසරේ පළමු මාස පහ තුළ සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට සමස්ත උද්ධමනය තනි අගයක් කරා ලඟා වනු ඇතැයි අපේක්ෂිත අතර, එය මධ්‍යකාලීනව මැදි තනි අගයක ස්ථායී වනු ඇත.

## මුදල් හා ණය

2022 වසරේ අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාත සැළකිය යුතු මට්ටමින් වැඩි වී ඉතිහාසයේ ඉහළම මට්ටම කරා ලඟා විය. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු කාර්තුව තෙක් වාර්තා වූ සංකෝචනයේ සිට ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසා දීමට 2023 වසරේ ජූනි මාසයේ සිට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කරන ලදී.

ඒ අනුව, 2023 වසරේ මාර්තු මාසයේ දී පිළිවෙලින් සියයට 15.50 ක් හා සියයට 16.50 ක් දක්වා පදනම් අංක 100 කින් ඉහළ නැංවූ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2023 වසරේ ජූනි මාසයේ දී පිළිවෙලින් සියයට 13.00 ක් හා සියයට 14.00 ක් දක්වා පදනම් අංක 250 කින් අඩු කර ඇති අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සියයට 4.0 මට්ටමෙහිම පවත්වා ගෙන ඇත.

## කොටස් වෙළෙඳපොළ

2022 වසරේ පැවති අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ පසු බලපෑම මධ්‍යයේ 2023 වසරේ පළමු මාස පහ තුළ මිල දර්ශක හා වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය යන අංශයන් සම්බන්ධයෙන් කොටස් වෙළෙඳපොළ අඩු කාර්යසාධනයක් දක්වන ලදී. සමස්ත කොටස් මිල දර්ශකය 2022 වසරේ මැයි මාසය අවසානයේ වූ ඒකක 8,108 සිට 2023 වසරේ මැයි මාසය අවසානයේ ඒකක 8,555 දක්වා සියයට 5.5 කින් වර්ධනය විය. වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය, 2022 වසරේ මැයි මාසය අවසානයේ වූ ඒකක 2,679 සිට 2023 වසරේ මැයි මාසය අවසානයේ ඒකක 2,421 දක්වා සියයට 9.6 කින් පහත වැටුණි.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය, 2022 වසරේ මැයි මාසය අවසානයේ වාර්තා වූ රු. බිලියන 3,611 සිට 2023 වසරේ මැයි මාසය අවසානයේ රු. බිලියන 3,598 දක්වා සියයට 0.4 කින් ආන්තික ලෙස පහත වැටුණි. මේ අතර, කොළඹ කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා කළ රු. මිලියන 4,077 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 1,481 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටුණි.

විදේශ විකුණුම්, 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ රු. මිලියන 23,744 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 13,809 දක්වා සියයට 41.8 කින් පහත වැටුණි. විදේශ මිලදී ගැනීම් ද, 2022 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ රු. මිලියන 22,577 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 15,168 දක්වා සියයට 32.8 කින් පහත වැටුණි. මෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන්, ශුද්ධ විදේශ මිලදී ගැනීම් 2023 වසරේ පළමු මාස පහ තුළ සියයට 216.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.

**1.2 වගුව : මුදල් හා පුද්ගලික අංශයට ලබා දුන් ණය**

රු. බිලියන

| අයිතමය | 2022 | | | | 2023 | | | | 2023 අප්‍රේල් /2022 අප්‍රේල් වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | |
| සංචිත මුදල් | 1,337.49 | 1,324.23 | 1,386.70 | 1,481.80 | 1,589.72 | 1,504.68 | 1,424.21 | 1,417.07 | -4.37 |
| පුළුල් මුදල් ($M_{2b}$) | 10,667.73 | 10,755.11 | 11,575.56 | 11,940.61 | 12,322.46 | 12,345.80 | 12,293.35 | 12,386.65 | 3.74 |
| පුද්ගලික අංශයට ලබා දුන් ණය | 7,017.77 | 7,051.28 | 7,533.54 | 7,752.83 | 7,318.02 | 7,260.39 | 7,152.77 | 7,109.55 | -8.30 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**1.3 වගුව : ප්‍රාග්ධන වෙළෙඳපොළ හැසිරීම**

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | මැයි අග වන විට 2022 | මැයි අග වන විට 2023 |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,052 | 6,129 | 6,774 | 12,226 | 8,490 | 8,108 | 8,555 |
| එස් ඇන්ඩ් පී. එස්. එල් 20 දර්ශකය | 3,135 | 2,937 | 2,638 | 4,233 | 2,636 | 2,679 | 2,421 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,840 | 2,851 | 2,961 | 5,489 | 3,847 | 3,611 | 3,598 |
| වෙළෙඳපොළ කටයුතු සිදු කරනු ලබන ලැයිස්තු ගත සමාගම් ගණන | 297 | 289 | 283 | 296 | 290 | 294 | 289 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 834 | 711 | 1,899 | 4,888 | 2,972 | 4,077 | 1,481 |
| විදේශ විකුණුම් (රු. මිලියන) | 100,316 | 68,272 | 104,165 | 86,689 | 36,863 | 23,744 | 13,809 |
| විදේශ මිලදී ගැණුම් (රු.මිලියන) | 77,067 | 56,537 | 52,889 | 39,410 | 67,488 | 22,577 | 15,168 |
| ශුද්ධ මිලදී ගැණුම් (රු.මිලියන) | -23,249 | -11,735 | -51,276 | -47,279 | 30,625 | -1,167 | 1,359 |

මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2023 වසරේ පළමු මාස පහ තුළ ස්ථාවර වීමේ ලකුණු ප්‍රදර්ශනය කළේය. වෙළෙඳ හිඟය අඩුවීම, සේවක ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම්වල සැලකිය යුතු වර්ධනය වීම මෙයට හේතු විය. සේවක ප්‍රේෂණවලින් ගලාඒම් සියයට 75.7 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. සංචාරක ඉපැයීම් සියයට 30.4 කින් වර්ධනය වූ අතර, මුළු අපනයන සියයට 7.7 කින් සංකෝචනය විය. මුළු ආනයන සියයට 22.8 කින් පහත වැටී ඇත; වෙළෙඳ හිඟය ඩොලර් මිලියන 1,926.0 දක්වා අඩු විය; සහ දළ නිල සංචිත ඩොලර් බිලියන 3.5 ක් විය.

ගෝලීය ඉල්ලුම අඩුවීම සහ පරිභෝජන රටාව සේවා අංශය දෙසට යොමු වීම සමඟ රෙදිපිළි සහ ඇගලුම්, රබර් නිෂ්පාදන, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ ඛනිජ තෙල් නිෂ්පාදන ඇතුළු කාර්මික අපනයනවලින් ඉපැයීම් සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් අපනයන ආදායම 2022 වසරේ පළමු මාස පහ තුළ වූ

**1.4 වගුව : විදේශ වෙළෙඳාම 2023 ජනවාරි - මැයි**

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2022 | 2023 | වෙනස % |
|---|---|---|---|
| **අපනයන** | **5,273.4** | **4,865.7** | **-7.7** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 974.5 | 1,017.9 | 4.5 |
| තේ | 460.9 | 524.0 | 13.7 |
| ප්‍රාථමික නිෂ්පාදන ( රබර් හා පොල් නිෂ්පාදන) | 195.8 | 148.0 | -24.4 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 317.8 | 345.9 | 8.8 |
| කාර්මික නිෂ්පාදන | 4,277.0 | 3,825.2 | -10.6 |
| රෙදිපිළි සහ ඇගලුම් | 2,408.5 | 2,030.6 | -15.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 291.1 | 207.8 | -28.6 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,577.4 | 1,586.8 | 0.6 |
| ඛනිජ නිෂ්පාදන | 14.2 | 10.8 | -23.9 |
| අනෙකුත් | 7.7 | 11.7 | 51.9 |
| **ආනයන** | **8,801.7** | **6,791.4** | -22.8 |
| පාරිභෝගික භාණ්ඩ | 1,353.7 | 1,241.7 | -8.3 |
| ආහාර හා පාන වර්ග | 767.8 | 698.7 | -9.0 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 585.9 | 543.0 | -7.3 |
| අතරමැදි භාණ්ඩ | 5,842.7 | 4,571.1 | -21.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 2,383.8 | 2,064.8 | -13.4 |
| පොහොර | 44.5 | 61.6 | 38.4 |
| රෙදිපිළි සහ ඇගලුම් | 1,404.7 | 999.9 | -28.8 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 2,009.7 | 1,444.8 | -28.1 |
| ආයෝජන භාණ්ඩ | 1,603.3 | 971.4 | -39.4 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,024.9 | 658.8 | -35.7 |
| ප්‍රවාහන උපකරණ | 87.5 | 30.8 | -64.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 489.0 | 280.7 | -42.6 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 1.9 | 1.1 | -42.1 |
| අනෙකුත් | 1.9 | 7.3 | 284.2 |
| **වෙළෙඳ ශේෂය** | **-3,528.3** | **-1,925.7** | **-45.4** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇ. ඩො. මිලියන 5,273.4 ට සාපේක්ෂව 2023 වසරේ එම කාලය තුළ ඇ. ඩො. මිලියන 4,865.7 ක් දක්වා සියයට 7.7 කින් හෝ ඇ. ඩො. මිලියන 407.7 කින් පහත වැටුණි. එමෙන්ම, පාරිභෝගික භාණ්ඩ, අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩවල පහත වැටීම හේතුවෙන් ආනයන වියදම් 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 8,801.7 ට සාපේක්ෂව 2023 වසරේ එම කාලය තුළ ඇ. ඩො. මිලියන 6,791.4 දක්වා සියයට 22.8 කින් හෝ ඇ. ඩො. මිලියන 2,010.3 කින් අඩු විය. ආනයන සහ අපනයන යන දෙකෙහිම පහත වැටීම, වෙළෙඳ හිඟය 2022 පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 2,528.3 ට සාපේක්ෂව 2023 එම කාල සීමාව තුළ ඇ. ඩො. මිලියන 1,925.7 දක්වා අඩු වීමට හේතු විය.

සේවක ප්‍රේෂණ, 2022 පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 1,336 ට සාපේක්ෂව 2023 වසරේ එම කාල සීමාව තුළ ඇ. ඩො. මිලියන 2,347 දක්වා සියයට 75.7 කින් හෝ ඇ.ඩො. මිලියන 1,011 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් 2022 වසරේ අග භාගයේ සිට ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සංක්‍රමණයේ කැපී පෙනෙන වර්ධනයක් සමග විශාල ලෙස ප්‍රේෂණ ගලා ඒම් සහ සංක්‍රමණික සේවකයන් සිය ප්‍රේෂණ සඳහා නිල මාර්ග භාවිතා කිරීමට දිරිගැන්වීම සඳහා මහ බැංකුව රජය සමඟ එක්ව ගෙන ඇති දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ඇතුළු ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හේතු විය.

ගෝලීය සංචාරක ව්‍යාපාරය අඛණ්ඩ ලෙස ප්‍රකෘතිමත් වීම හේතුවෙන් සංචාරක ඉපැයීම්, 2022 පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 635.0 හා සසඳන විට 2023 එම කාලය තුළ ඇ. ඩො. මිලියන 828.0 දක්වා සියයට 30.4 කින් වැඩි විය. සංචාරක පැමිණීම් 2022 පළමු මාස පහ තුළ වූ 378,521 ට සාපේක්ෂව 2023 එම කාලය තුළ 524,486 දක්වා වර්ධනය විය. මෙම කාලය තුළ බොහෝ සංචාරකයින් පැමිණ ඇත්තේ රුසියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් වලින් වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) 2022 පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 92 ට සාපේක්ෂව 2023 එම කාලය තුළ ඇ. ඩො. මිලියන 3 ක් දක්වා ශුද්ධ ගලා ඒමේ සැලකිය යුතු අඩුවීමක් වාර්තා කරන ලදි. ඊට වෙනස්ව, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත දළ ගලා ඒම් 2022 පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 9 සිට 2023 එම කාලය තුළ ඇ. ඩො. මිලියන 398 දක්වා කැපී පෙනෙන ලෙස වැඩි විය. මේ අතර, චීනයේ මහජන බැංකුවෙන් ලද ඇ. ඩො. බිලියන 1.4ක හුවමාරු පහසුකම ඇතුළුව දළ නිල සංචිතය 2023 මැයි මස අවසන් වන විට ඇ. ඩො. බිලියන 3.5ක් විය. සමස්ත ගෙවුම් ශේෂය (BoP) 2022 මැයි මස අවසන් වන විට පැවති ඇ. ඩො. මිලියන 2,595 ක හිඟයට සාපේක්ෂව 2023 එම කාලය තුළ ඇ. ඩො. මිලියන 1,597 ක අතිරික්තයක් වාර්තා කරන ලදි. ශ්‍රී ලංකා රුපියල, 2023 ජූනි 28 වන විට ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 17.6 කින් සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය.

### අපනයන

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොලවල ගෝලීය ඉල්ලුම අඩු වීම පිළිබිඹු කරමින් කාර්මික අපනයන පහත වැටීම හේතුවෙන් අපනයනවලින් ලද ආදායම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 5,273.4ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 4,865.7 දක්වා සියයට 7.7 කින් පහත වැටුණි. රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදන, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදනවලින් අපනයන ආදායම පිළිවෙලින් ඇ. ඩො. මිලියන 2,030.6 දක්වා සියයට 15.7 කින්, ඇ.ඩො. මිලියන 360.5 දක්වා සියයට 8.5කින්, ඇ.ඩො. මිලියන 207.8 දක්වා සියයට 28.6 කින් සහ ඇ.ඩො. මිලියන 208.6 දක්වා සියයට 6.1 කින් අඩුවීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 4,277.0 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 3,825.2 දක්වා සියයට 10.6 කින් අඩු විය. රසායනික නිෂ්පාදන, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, දැව සහ කඩදාසි නිෂ්පාදන, ප්‍රවාහන උපකරණ, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන්, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, පිඟන් මැටි නිෂ්පාදන වැනි අනෙකුත් කාර්මික අපනයනවලින් ඉපැයීම් ද පහළ ගියේය. කෙසේ වෙතත්, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, සත්ත්ව ආහාර සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන 2023 වසරේ පළමු මාස පහ තුළ මුළු අපනයන ආදායමට ධනාත්මක ලෙස දායක විය.

ප්‍රධාන වශයෙන් අපනයන ඉපයීම්, තේවලින් ඇ. ඩො. මිලියන 524.0 දක්වා සියයට 13.7 කින්, කුළු බඩුවලින් ඇ. ඩො. මිලියන 148.2 දක්වා සියයට 16 කින්, හා මුහුදු ආහාර ඇ. ඩො. මිලියන 114.5 දක්වා සියයට 8.2 කින් වැඩි වීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ඉපයීම් 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 974.5 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,017.9 දක්වා සියයට 4.5 කින් සුළු වශයෙන් වැඩි විය. එළවළු සහ සකස් නොකළ දුම්කොළ ඉපැයීම් ද පිළිවෙලින් ඇ. ඩො. මිලියන 11.8 දක්වා සියයට 25.8 කින් සහ ඇ. ඩො. මිලියන 11.0 දක්වා සියයට 25.3 කින් වැඩි විය. කෙසේ වෙතත්, 2023 පළමු මාස පහ තුළ පොල්, සුළු කෘෂිකාර්මික අපනයන සහ රබර් ඉපැයීම් පිළිවෙලින් ඇ. ඩො. මිලියන 132.6 දක්වා සියයට 24.4 කින්, ඇ. ඩො. මිලියන 60.5 දක්වා සියයට 8.5 කින් සහ ඇ. ඩො. මිලියන 15.4 දක්වා සියයට 24.8 කින් පහත වැටුණි.

### ආනයන

පාරිභෝගික, අන්තර් හා ආයෝජන භාණ්ඩ මත අඩු වූ ආනයන වියදම් හේතුවෙන් ආනයන වියදම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 8,801.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 6,791.4 දක්වා සියයට 22.8 හෝ ඇ. ඩො. මිලියන 2,010.3 කින් සැලකිය යුතු ලෙස අඩු විය.

ආහාර සහ පාන වර්ග, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ, ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රසායනික නිෂ්පාදන, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, කඩදාසි සහ සන කඩදාසි වැනි ප්‍රධාන ආනයන කාණ්ඩවල පහත වැටීම කැපී පෙනුණි.

ප්‍රධාන වශයෙන් ආහාර සහ පාන වර්ග සහ ආහාර නොවන පරිභෝගික භාණ්ඩ යන දෙකෙහිම ආනයන වියදම් පහත වැටීම හේතුවෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 1,353.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,241.7 දක්වා සියයට 8.3 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ඇ. ඩො. මිලියන 220.5 දක්වා සියයට 123.7 කින් සීනි සහ රසකැවිලි ආනයන වියදමෙහි වූ කැපී පෙනෙන වැඩිවීම හැර ආහාර සහ පාන වර්ග ආනයන වියදම, අනෙකුත් සියලුම උප කාණ්ඩවල පහත වැටීමත් සමඟ 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 767.8 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 698.7 දක්වා සියයට 9.0 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, බෙහෙත් සහ ඖෂධ සඳහා වන වියදම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 230.7ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 306.4 දක්වා සියයට 32.9කින් හා පුද්ගලික වාහන සඳහා වන වියදම 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 2.7ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 12.5 දක්වා සියයට 271.4 කින් සැළකිය යුතු ලෙස වැඩි වී තිබියදීත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවලින් අඩු වූ ආනයන වියදම 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 585.8ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 543.1 දක්වා සියයට 7.3කින් වර්ධනය විය.

තිරිඟු සහ ඉරිඟු, කෘෂිකාර්මික යෙදවුම්, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ, සහ පොහොර හැර අනෙකුත්

**1.5 වගුව : ලෝක තත්ත්වයන් සංක්ෂිප්තව 2022**

| රට | 2022 | | | | |
|---|---|---|---|---|---|
| | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශතක වෙනස) | උද්ධමනය (ප්‍රතිශතය) | සේවා වියුක්තිය (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස) | දළ ණය (ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස) |
| ආර්ජන්ටිනාව | 5.2 | 72.4 | 7.0 | -3.9 | 84.5 |
| ඕස්ට්‍රේලියාව | 3.7 | 6.6 | 3.7 | -3.3 | 55.7 |
| බ්‍රසීලය | 2.9 | 9.3 | 7.9 | -4.6 | 85.9 |
| කැනඩාව | 3.4 | 6.8 | 5.3 | -0.7 | 106.6 |
| චිලී | 2.4 | 11.6 | 7.9 | -1.3 | 38.0 |
| චීනය | 3.0 | 1.9 | 4.2 | -7.5 | 77.1 |
| ප්‍රංශය | 2.6 | 5.9 | 7.3 | -4.9 | 111.1 |
| ජර්මනිය | 1.8 | 8.7 | 3.1 | -2.6 | 66.5 |
| ග්‍රීසිය | 5.9 | 9.3 | 12.2 | -4.0 | 177.4 |
| ඉන්දියාව | 6.8 | 6.7 | .... | -9.6 | 83.1 |
| ඉන්දුනීසියාව | 5.3 | 4.2 | 5.9 | -2.3 | 39.9 |
| ඉතාලිය | 3.7 | 8.7 | 8.1 | -8.0 | 144.7 |
| ජපානය | 1.1 | 2.5 | 2.6 | -7.8 | 261.3 |
| කොරියාව | 2.6 | 5.1 | 2.9 | -0.9 | 54.3 |
| මැලේසියාව | 8.7 | 3.4 | 3.8 | -5.3 | 66.3 |
| මෙක්සිකෝව | 3.1 | 7.9 | 3.3 | -4.4 | 56.0 |
| රුසියාව | -2.1 | 13.8 | 3.9 | -2.2 | 19.6 |
| සිංගප්පූරුව | 3.6 | 6.1 | 2.1 | -0.4 | 134.2 |
| දකුණු අප්‍රිකාව | 2.0 | 6.9 | 33.5 | -4.5 | 71.0 |
| ස්පාඤ්ඤය | 5.5 | 8.3 | 12.9 | -4.5 | 112.0 |
| ශ්‍රී ලංකාව | -7.8 | 46.4 | 4.7 | -10.2 | 113.8 |
| තායිලන්තය | 2.6 | 6.1 | 1.0 | -5.5 | 60.5 |
| එක්සත් රාජධානිය | 4.0 | 9.1 | 3.7 | -6.3 | 102.6 |
| එක්සත් ජනපදය | 2.1 | 8.0 | 3.6 | -5.5 | 121.7 |
| වියට්නාමය | 8.0 | 3.2 | 2.3 | -2.5 | 37.1 |
| වෙනිසියුලාව | 8.0 | 201.0 | ... | -6.0 | 157.8 |

මූලාශ්‍ර: *World Economic Outlook*, ජා.මූ.අ. අප්‍රේල් 2023
*Fiscal Monitor*, ජා.මූ.අ. අප්‍රේල් 2023
ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වාර්ෂික වාර්තාව

සියලුම උප අංශවල වියදම් පහත වැටීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 5,842.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 4,571.1 දක්වා සියයට 21.8 කින් අඩු විය. ගෝලීය ඉල්ලුම අඩුවීමත් සමඟ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉපැයීම් ක්‍රමයෙන් අඩු වීම පිළිබිඹු කරමින් 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 1,404.7 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 999.9 දක්වා සියයට 28.8 කින් සැලකිය යුතු ලෙස අඩුවිය මේ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළේ ඉන්ධන මිල පහත වැටීම සහ සියලුම පාරිභෝගිකයන් සඳහා සතිපතා කෝටාව සහතික කිරීමට ඉන්ධන සඳහා QR කේතය ක්‍රියාත්මක කිරීමත් සමඟ රජය විසින් ඉන්ධන භාවිතය සීමා කිරීම හේතුවෙන්, පිරිපහදු කළ ඛනිජ තෙල් සියයට 36.6 කින් සැලකිය යුතු ලෙස පහත වැටීමත් සමඟ 2023 මුල් මාස පහ තුළ ඉන්ධන ආනයන බිල සියයට 13.4 කින් හෝ ඇ. ඩො. මිලියන 319.0 කින් ඇ. ඩො. මිලියන 2,064.8 ක් දක්වා අඩු විය. රසායනික නිෂ්පාදන (සියයට 26.6 කින් ඇ. ඩො. මිලියන 321.4 දක්වා), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 43.8 කින් ඇ. ඩො. මිලියන 180.0 දක්වා), කඩදාසි සහ ඝන කඩදාසි (සියයට 15.5 කින් ඇ. ඩො. මිලියන 173.3 දක්වා), මූල ලෝහ (සියයට 58.8 කින් ඇ. ඩො. මිලියන 91.2 දක්වා) රබර් (සියයට 55.1 කින් ඇ. ඩො. මිලියන 68.4 දක්වා) සහ ඛනිජ නිෂ්පාදන (සියයට 61.2 කින් ඇ.ඩො. මිලියන 28.6 දක්වා) වැනි අනෙකුත් අතරමැදි භාණ්ඩ ද පහත වැටීමක් වාර්තා කරන ලදි.

ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව පැවති දුර්වල දේශීය ඉල්ලුමත් සමඟ, පිළිවෙලින් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා වන වියදම් ඇ. ඩො. මිලියන 658.8 දක්වා සියයට 35.7 කින්, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇ.ඩො. මිලියන 280.7 දක්වා සියයට 42.6 කින් සහ ප්‍රවාහන උපකරණ ඇ. ඩො. මිලියන 30.8 දක්වා සියයට 64.8 කින් පහත වැටීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2022 වසරේ පළමු මාස පහ තුළ වූ ඇ. ඩො. මිලියන 1,603.3 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො මිලියන 971.3 දක්වා සියයට 39.4 කින් අඩු විය.

## ගෝලීය ආර්ථික ප්‍රවණතා[1]

ආහාර හා බලශක්ති ආශ්‍රිත උද්ධමනය අඩු වීම මෙන්ම ස්ථාවර වර්ධන අපේක්ෂාවන් හේතුවෙන් ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කළ ද, තවදුරටත් පවතින අභියෝග හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධන වේගය අඛණ්ඩව අඩපණ කරනු ලබයි. කොවිඩ්-19 වසංගතය සහ රුසියානු-යුක්රේන ගැටුම ඇතුළුව පසුගිය වසර තුන තුළ ඇති වූ අහිතකර කම්පනවල පසු බලපෑම් ගෝලීය ආර්ථිකයට අඛණ්ඩව බලපෑම් ඇති කරනු ලබයි.

2022 වසරේ දී බොහෝ රටවල වාර්තා වූ ඓතිහාසික වශයෙන් ඉහළ උද්ධමනයට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිපත්ති අනුපාත ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් මූල්‍ය අංශය අවදානමට ලක්ව ඇති බැවින් අවිනිශ්චිතතාවය ඉහළ මට්ටමක පවතී. මීට අමතරව, 2022 වසරේ දී රටවලට බලපෑ බොහෝ අහිතකර ආර්ථික තත්ත්වයන් 2023 වසරේ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ: උද්ධමනය පාලනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් දැඩි කිරීම, රුසියානු-යුක්රේන ගැටුම නිසා අඛණ්ඩව ඇති වූ භූ දේශපාලනික අවිනිශ්චිතතාවයන් සහ භාණ්ඩ මිල ඉහළ යාම හා ඉහළ ණය මට්ටම් මධ්‍යයේ මූල්‍ය අවකාශය සීමා වීම යන අභියෝග ඒ අතර වේ. මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති දුර්වලතා සමඟ මෙම අභියෝග තවත් ප්‍රබල වන අතර, උද්ධමනය පහත හෙළීම, වර්ධනය පවත්වා ගැනීම සහ මූල්‍ය අංශයේ ස්ථායීතාව රැක ගැනීම යන තුන් අංශයම එක අවස්ථාවේ දී ළඟා කර ගැනීම ප්‍රතිපත්ති සම්පාදකයන්ට දුෂ්කර වනු ඇත.

## ගෝලීය ආර්ථික වර්ධනය

2022 වසරේ දී වූ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව, ගෝලීය ආර්ථික වර්ධනය 2023 වසරේ දී සියයට 2.8 කින් මන්දගාමීව වර්ධනය වනු ඇති අතර, 2024 වසරේ දී සියයට 3.0 කින් පමණ මන්දගාමී වේගයක් අත් කර ගනු ඇත. කෙසේ වුවද, මූල්‍ය අංශයේ අවිනිශ්චිතතාවයන් පාලනය කළ නොහැකි වුවහොත්, 2023 වසරේ දී ගෝලීය වර්ධනය සියයට 2.5 ක් දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023 වසරෙන් ඔබ්බට, ගෝලීය ආර්ථික වර්ධනය මධ්‍ය කාලීනව, සියයට 3.0 කට වැඩි, එහෙත් පූර්ව වසංගත මට්ටමට වඩා අඩු අගයක ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2022 වසරේ දී සියයට 2.7 සිට 2023 වසරේ දී සියයට 1.3 දක්වා සහ 2024 වසරේ දී සියයට 1.4 දක්වා සාපේක්ෂව මන්දගාමී වර්ධනයක් අත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්ගෙන් සියයට 90 ක් පමණ 2023 වසරේ දී සංකෝචනයක් අත් කර ගනු ඇතැයි පුරෝකථනය කර ඇත. උදාහරණයක් ලෙස ජර්මනිය (සියයට -0.1 කින්) සහ එක්සත් රාජධානිය (සියයට -0.3 කින්) 2023 වසරේ දී සංකෝචනයන් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2022 වසරේ දී සියයට 4.0 සිට 2023 වසරේ දී සියයට 3.9 දක්වා සහ 2024 වසරේ දී සියයට 4.2 දක්වා වන වර්ධන අනුපාත සමඟ ඉහළ ප්‍රකෘතියක් ළඟා කර ගනු ඇත. 2023 වසරේ දී සියයට 5.2 ක් සහ 2024 වසරේ දී සියයට 4.5 ක් ලෙස චීනයේ අපේක්ෂිත වර්ධනය සහ 2023 වසරේ දී සියයට 5.9 ක් සහ 2024 වසරේ දී සියයට 6.3 ක්

1 World Economic Outlook (2023 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), Fiscal Monitor (2023 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), Global Financial Stability Report (2023 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), Commodity Markets Outlook (2023 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), Global Economic Prospects (2023 ජූනි, ලෝක බැංකුව), සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන් හා අන්තර්ජාලයෙන් ලබා ගන්නා ලද වෙනත් දත්ත හා තොරතුරු මත පදනම්ව ඇත.

ලෙස ඉන්දියාවේ අපේක්ෂිත වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියානු රටවල ආර්ථිකය 2023 වසරේ සහ 2024 වසරේ දී පිළිවෙළින් සියයට 5.3 කින් සහ සියයට 5.1 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### උද්ධමනය

ගෝලීය උද්ධමනය 2022 වසරේ දී සියයට 8.7 සිට 2023 වසරේ දී සියයට 7.0 දක්වා සහ 2024 වසරේ දී සියයට 4.9 දක්වා අඩු වනු ඇත. සියලු ප්‍රධාන රටවල් කණ්ඩායම්වල උද්ධමනය පහත වැටීම අපේක්ෂා කරන අතර, 2023 වසරේ දී ආර්ථිකයන්ගෙන් සියයට 76 ක් පමණ මතුපිට උද්ධමනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි පාරිභෝගික මිල ගණන් 2022 වසරේ දී සියයට 7.3 සිට 2023 වසරේ දී සියයට 4.7 දක්වා සහ 2024 වසරේ දී සියයට 2.6 දක්වා අඩු වීමට නියමිතව ඇත. නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය 2022 වසරේ දී සියයට 9.8 සිට 2023 වසරේ දී සියයට 8.6 දක්වා සහ 2024 වසරේ දී සියයට 6.5 දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියානු රටවල්හි උද්ධමනය 2023 වසරේ දී සියයට 3.4 සහ 2024 වසරේ දී සියයට 3.0 ලෙස මධ්‍යස්ථව පවතිනු ඇත. කෙසේ වෙතත්, 2023 වසරේ දී යුරෝපයේ (සියයට 19.7), ලතින් ඇමෙරිකාවේ සහ කැරිබියන් කලාපයේ (සියයට 13.3), මැද සහ මධ්‍යම ආසියාවේ (සියයට 15.9) සහ උප-සහරාන් අප්‍රිකාවේ (සියයට 14.0) නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල උද්ධමනය ඉලක්කම් දෙකක අගයක් දක්වා මට්ටමට ඉහළ ගොස් පවතිනු ඇත.

**1.6 වගුව : ජාත්‍යන්තර භාණ්ඩ මිළ ගණන්**

| අයිතමය | ඒකකය | තත්‍ය 2021 | 2022 | පුරෝකථන 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **බලශක්ති** | | | | | |
| ගල් අගුරු, ඕස්ට්‍රේලියාව | ඇ.ඩො./මෙ.ටො. | 138.1 | 344.9 | 200.0 | 155.0 |
| බොරතෙල්, සාමාන්‍යය* | ඇ. ඩො./බැරලයට | 70.4 | 99.8 | 84.0 | 86.0 |
| ස්වාභාවික ගෑස්, එක්සත් ජනපදය | ඇ. ඩො. /මෙට්‍රික් බ්‍රිතාන්‍ය තාප ඒකක මිලියන | 3.9 | 6.4 | 2.7 | 3.7 |
| **බලශක්ති නොවන** | | | | | |
| **කෘෂිකාර්මික** | | | | | |
| **පාන වර්ග** | | | | | |
| කොකෝවා | ඇ.ඩො./කි.ග්‍රෑ. | 2.4 | 2.4 | 2.7 | 2.6 |
| කෝපි, රොබොස්ටා | ඇ.ඩො./කි.ග්‍රෑ. | 2.0 | 2.3 | 2.3 | 2.3 |
| තේ | ඇ.ඩො./කි.ග්‍රෑ. | 2.7 | 3.1 | 2.7 | 2.8 |
| **ආහාර** | | | | | |
| **තෙල් සහමේද** | | | | | |
| පාම් තෙල් | ඇ.ඩො./මෙ.ටො. | 1,131.0 | 1,276.0 | 980.0 | 1,020.0 |
| සෝයා බෝංචි ආහාර | ඇ.ඩො./මෙ.ටො. | 481.0 | 548.0 | 590.0 | 570.0 |
| සෝයාබෝංචි | ඇ.ඩො./මෙ.ටො. | 583.0 | 675.0 | 590.0 | 540.0 |
| **ධාන්‍ය** | | | | | |
| බඩ ඉරිඟු | ඇ.ඩො./මෙ.ටො. | 260.0 | 319.0 | 270.0 | 240.0 |
| සහල් | ඇ.ඩො./මෙ.ටො. | 458.0 | 437.0 | 510.0 | 490.0 |
| තිරිඟු | ඇ.ඩො./මෙ.ටො. | 315.0 | 430.0 | 355.0 | 335.0 |
| **අනෙකුත් ආහාර** | | | | | |
| සීනි | ඇ.ඩො./කි.ග්‍රෑ. | 0.4 | 0.4 | 0.5 | 0.5 |
| **අමුද්‍රව්‍ය** | | | | | |
| කපු | ඇ.ඩො./කි.ග්‍රෑ. | 2.2 | 2.9 | 2.2 | 2.3 |
| රබර් | ඇ.ඩො./කි.ග්‍රෑ. | 1.7 | 1.5 | 1.4 | 1.5 |
| ඉරන ලද දැව | ඇ.ඩො./ඝන මීටර | 750 | 675 | 680 | 689 |
| **ලෝහ සහ ඛනිජ වර්ග** | | | | | |
| ඇලුමිනියම් | ඇ.ඩො./මෙ.ටො. | 2,473 | 2,705 | 2,400 | 2,450 |
| තඹ | ඇ.ඩො./මෙ.ටො. | 9,317 | 8,822 | 8,500 | 8,000 |
| නිකල් | ඇ.ඩො./මෙ.ටො. | 18,465 | 25,834 | 22,000 | 20,000 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මිල පුරෝකථන

* එක්සත් රාජධානිය බ්‍රෙන්ට්, ඩුබායි හා බටහිර ටෙක්සාස් නිශ්චිත මිල අනුව සාමාන්‍ය බනිජ තෙල් මිල දැක්වේ

### පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

2022 වසරේ ජුනි මාසයේ පැවති උපරිම මට්ටමට සාපේක්ෂව, 2023 වසරේ මාර්තු වන විට, පාරිභෝගික භාණ්ඩ මිල ගණන් දළ වශයෙන් සියයට 30 කින් පමණ සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2022 වසරේ අවසාන කාර්තුවට සාපේක්ෂව බලශක්ති මිල ගණන්, 2023 පළමු කාර්තුවේ දී සියයට 20 කින් සැලකිය යුතු ලෙස අඩු විය. 2023 වසරේ දී දැවි තෙල් මිල ගණන් සියයට 24 කින් සහ 2024 වසරේ දී තවත් සියයට 5.8 කින් පමණ අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඉන්ධන නොවන භාණ්ඩ මිල සාපේක්ෂව ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහළ නිෂ්පාදන පිරිවැය සහ දේශීය හා ගෝලීය ඉල්ලුමේ තිරසාර වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික මිල දර්ශකය 2021 වසරේ දී 108.31 සිට 2022 වසරේ දී 122.75 දක්වා වැඩි විය. කෙසේ වෙතත්, යෙදවුම් පිරිවැය අඩුවීම සහ කෘෂිකාර්මික සැපයුම් ඉහළ යාමත් සමඟ කෘෂිකාර්මික මිල ගණන් 2023 වසරේ දී සියයට 7 කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ගෝලීය වෙළඳාම

වසංගතය හේතුවෙන් ඇති වූ ගෝලීය ආර්ථික අවපාතයේ පසු බලපෑම් සහ වෙළෙඳ භාණ්ඩ සිට දේශීය සේවාවන් වෙත පරිභෝජනය මාරුවීම සමඟ, ලෝක වෙළඳ පරිමාවේ වර්ධනය 2022 වසරේ දී සියයට 5.1 සිට 2023 වසරේ දී සියයට 2.4 දක්වා සහ 2024 වසරේ දී සියයට 3.5 ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### මුදල් සහ මූල්‍ය අංශය

ලොව පුරා පවතින ඉහළ උද්ධමනයට ප්‍රතිචාර වශයෙන්, පසුගිය වසර දෙක තුළ ලොව පුරා මහ බැංකු පොලී අනුපාත ඉහල දැමීම් ක්‍රියාවට නැංවීය. එවැනි අනුපාත වැඩිවීම් හේතුවෙන්, මූල්‍ය වත්කම්වල, විශේෂයෙන්ම ස්ථාවර කුපන්පත් සහිත බැඳුම්කරවල වටිනාකම සැලකිය යුතු ලෙස අඩු කර ඇත. පවතින උද්ධමන පීඩනය මධ්‍යයේ මූල්‍ය වෙළෙඳපොළවල අවිනිශ්චිතතාවයන් කළමනාකරණය කිරීම අභියෝගාත්මක වේ. උද්ධමනය නැවත ඉලක්කගත මට්ටමට ගෙන ඒමේ දී මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමේ දුෂ්කර කාර්යයට මුහුණ දෙන දියුණු ආර්ථිකයන් සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම සත්‍ය වේ. අනෙක් අතට, නැගී එන වෙළෙඳපොළවල් ගෝලීය මූල්‍ය තත්ත්වයේ හදිසි දැඩි කිරීම් සහ ප්‍රාග්ධන පිටතට ගලායාම් වැඩි වීමේ අවදානමට නිරාවරණය වී ඇත.

අවදානමට ලක්විය හැකි මූල්‍ය අංශයන් සතු, සීමිත රාජ්‍ය මූල්‍ය ශක්‍යතාවයක් ඇති හෝ එවැනි ශක්‍යතාවයක් නොමැති සහ සැළකිය යුතු බාහිර මූල්‍ය අවශ්‍යතා සහිත රටවල් දැනටමත් සැළකිය යුතු පීඩනයකට ලක්ව ඇති අතර, අක්‍රමවත් ලෙස කොන්දේසි දැඩි කිරීමක් සිදුවුවහොත් තවදුරටත් දැඩි අභියෝගවලට මුහුණ දීමට සිදු වනු ඇත.

#### විශේෂ සටහන 1.1 ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම

ශ්‍රී ලංකාව වසර ගණනාවක සිට ඉහළ රාජ්‍ය ණය බර හේතුවෙන් පීඩාවට ලක්ව සිටියි. රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටම් දක්වා සැළකිය යුතු ලෙස ඉහළ යාමට 2019 වසර අවසානයේ දී හඳුන්වාදුන් බදු ප්‍රතිපත්තියෙහි වෙනස්වීම් නිසා අයවැය හිඟය තියුණු ලෙස ඉහළ යාම සහ වසංගතයෙහි අහිතකර බලපෑම් හේතු විය. ප්‍රධාන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම හේතුවෙන් 2020 වසරේ මුල් භාගය වන විට ශ්‍රී ලංකාවට ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ප්‍රවේශ වීමට පැවති අවස්ථාව අහිමි විය. මේ අනුව, ශ්‍රී ලංකාව අඛණ්ඩව වසරකට ඇ.ඩො. බිලියන 5ත් 6ත් අතර ප්‍රමාණයක විදේශ ණය සේවාකරණයක් සිදු කළ අතර ණය ප්‍රතිමූල්‍යකරණය සඳහා විදේශ ප්‍රාග්ධනය ඉහළ නැංවීමට අසමත් විය. මෙම ක්‍රියාවලිය තුළ විදේශ සංචිත ඉතා තියුණු ලෙස ක්ෂය වූ අතර 2022 වසරේ අප්‍රේල් මාසය වන විට භාවිතයට ගත හැකි සංචිත ප්‍රමාණය නොගිනිය හැකි මට්ටමකට ලඟාවීමත් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කරන තුරු විදේශ ණය සේවාකරණය අත්හිටුවන බව ඒකපාර්ශවීය ලෙස නිවේදනය කිරීමට රජයට සිදුවිය.

විස්තීරණ ණය පහසුකම (EFF) ලබා ගැනීමේ අරමුණ ඇතිව 2022 වසරේ අප්‍රේල් මස දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විධිමත් ලෙස සාකච්ඡා ආරම්භ කළේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) රීති අනුව තිරසාර නොවන මට්ටම්වල ණය පවතින රටවලට මූල්‍ය පහසුකම් ලබා දීමට අවස්ථාව ලබා නොදෙන බැවින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම තීරණාත්මක පූර්ව අවශ්‍යතාවයක් බවට පත් විය. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සම්බන්ධ වීම හා සමගාමීව, මූල්‍ය උපදේශකවරුන් වන ලසාඩ් ෆෙරස් (Lazard Freres) සහ නීති උපදේශකයින් වන ක්ලිෆර්ඩ් චාන්ස් (Clifford Chance) ගේ සහය ඇතිව රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය ද රජය විසින් ආරම්භ කරන ලදී.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ මූලික පියවර අතුරින් එකක් වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ණය තිරසාර භාවය සම්බන්ධයෙන් විශ්ලේෂණයක් (DSA) සිදුකිරීමයි. ණය තිරසාරභාවය සම්බන්ධ විශ්ලේෂණය මඟින් ඉදිරි කාලපරිච්ඡේදය සඳහා වන රටෙහි සාර්ව ආර්ථික රාමුව ගෙනහැර දක්වන අතර, රටෙහි ණය තිරසාරභාවය තහවුරු කිරීමට අවශ්‍ය රාජ්‍ය ණය අඩු කිරීම පිළිබඳ තක්සේරුවක් සිදු කරයි. මූලික වශයෙන්, ණය හිමියන් වෙත පියවිය යුතු ණය ප්‍රමාණයෙහි අඩු වීම හා දේශීය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙහි සංකලනයෙන් කාලයත් සමඟ රාජ්‍ය ණය ප්‍රමාණයෙහි අඩු කිරීම සිදු කරනු ලැබේ. මෙයින් පළමුවැන්න ළඟා කරගනු ලබන්නේ රාජ්‍ය ආදායම වැඩි කිරීම සහ වියදම් කළමනාකරණය හරහා අයවැය හිඟය අඩු කිරීමෙනි. මෙමඟින් ණයගැති බවට පත්වූ රටේ පුරවැසියන් මත පැටවුණු ණය බර බෙදා ගැනීමක් කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස නොපියවූ ණය ප්‍රමාණයෙහි ශුද්ධ වර්තමාන අගයෙහි වටිනාකම අඩු වීම යනු ණය හිමියන් විසින් දරන ලද ණය ප්‍රමාණය බෙදා ගැනීම වේ. මෙයින් දෙවැන්න ළඟා කර ගනු ලබන්නේ ණය හිමියන් විසින් දරනු ලබන පියවිය යුතුව පවතින ණය මෙවලම් (debt instruments) මත පවතින ණය ප්‍රමාණ නාමික වශයෙන් අඩු කිරීම, කල් පිරීමේ කාලය දිගු කිරීම, කූපන් ප්‍රමාණයෙහි අඩු කිරීම ආදියෙහි සංකලනයක් තුළිනි.

ණය තිරසාරභාවය නැවත ඇති කිරීම සඳහා රාජ්‍ය ණය සැළකිය යුතු ලෙස අඩු කිරීමේ අවශ්‍යතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය සම්බන්ධයෙන් වූ විශ්ලේෂණය මඟින් පිළිබිඹු කරනු ලබයි. ණය තිරසාරභාවය සම්බන්ධයෙන් වූ විශ්ලේෂණයෙහි (DSA) හි ප්‍රධාන දර්ශක තුනක් දක්වා ඇත.

**වගුව 1 : ණය තිරසාරභාවයෙහි ප්‍රධාන දර්ශක තුන**

| දර්ශකය | 2022 | 2027-2032 |
|---|---|---|
| රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 128% | 95% (2032) |
| දළ මූල්‍ය අවශ්‍යතාවය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 34.5% | 13% |
| විදේශ ණය සේවාකරණ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 9.4% | 4.5% |

ඒ අනුව, 2023-2027 කාලය තුළ අපේක්ෂිත ණය සේවාකරණයෙහි අඩුවීම ඇ.ඩො. බිලියන 17 ක් වනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ණයහිමියන්ගෙන් අපේක්ෂා කරනු ලබන සුවිශේෂී දායකත්වයකි. රජයේ වාර්ෂික දළ මූල්‍යයන අවශ්‍යතා සඳහා දේශීය ණයකරණයෙහි දායකත්වය අනුව දේශීය රාජ්‍ය ණය හිමියන්ගේ දායකත්වය ද මෙයට ඇතුළත් ය. රටෙහි මූල්‍ය අංශයේ ස්ථායීතාවයට හානියක් නොවන පරිදි අපේක්ෂිත ණය ඉලක්ක සපුරා ගැනීම සඳහා දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) ක්‍රියාවලිය නියමිත පරිදි ප්‍රමාණීකරණය කර ඇත.

රාජ්‍ය ණය අඩු කිරීම සඳහා ණය හිමියන්ගේ දායකත්වය සැලකිල්ලට ගැනීමේදී, ශ්‍රී ලංකාවේ පුරවැසියන් ණය බර බෙදා හදා ගැනීම තුළින් ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ළඟා කරගනු ලබන්නේ අයවැය හිඟය අඩු කිරීම සහ විශේෂයෙන්ම අයවැයෙහි ප්‍රාථමික හිඟය අඩු කිරීම (ආදායම - වියදම් + පොලී පිරිවැය) තුළිනි. ඒ අනුව, 2025 වසරේ සිට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය සම්බන්ධයෙන් වූ විශ්ලේෂණයට ඇතුළත් කර ඇති අතර, එය විශේෂයෙන්ම දළ මූල්‍යයන අවශ්‍යතා පිළිබඳ ඉලක්කය සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ අයවැයෙහි සැකැස්ම සළකා බැලීමේ දී අයවැය හිඟය අඩු කිරීමේ ප්‍රධාන උත්සාහය වනුයේ රාජ්‍ය ආදායම වැඩි දියුණු කිරීම වේ. මෙයට හේතුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම ගෝලීය වශයෙන් වන සාමාන්‍ය අගයට වඩා (2022 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.2) සැළකිය යුතු ලෙස අඩු වීමත්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18 ත් 20 ත් අතර පරාසයක පවතින රජයේ වියදම් ගෝලීය වශයෙන් වන සාමාන්‍ය අගයන් හා සළකා බැලීමේ දී ඉහළ මට්ටමක නොපැවතීමත්ය. තවද, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, පොදු ප්‍රවාහනය, ඩිජිටල්කරණය සහ වෙනත් ක්ෂේත්‍ර සඳහා තවදුරටත් වියදම් අවශ්‍ය වනු ඇත.

මෙම සන්දර්භය තුළ රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ අඛණ්ඩ උත්සාහයන් සැළකිය යුතු වැදගත්කමක් දරනු ලබයි. ණය හිමියන් විසින් ශ්‍රී ලංකාව වෙත ලබා දුන් ණය මත වන සැළකිය යුතු අලාභයන් දරා ගන්නා ලෙස ශ්‍රී ලංකාව ඉල්ලා සිටින බැවින්, ණය හිමියන් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන්ද ඉතා දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රයත්නයන් අපේක්ෂා කරන බව හොඳින් වටහාගෙන ඇත. ණය ප්‍රතිව්‍යූහගත කිරීමේ ක්‍රියාවලියේදී බදු ගෙවන්නන් හට ශුද්ධ වර්තමාන වටිනාකමෙහි අලාභ උකහා ගැනීමට සිදුවන නිල ද්විපාර්ශ්වික ණය හිමියන් සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම සත්‍ය වේ.

2022 සහ 2023 වසරවලදී බදු ප්‍රතිපත්තියෙහි සිදු කරන ලද සැළකිය යුතු වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නැංවීමත් සමඟ මේ සඳහා වන ශ්‍රී ලංකාවේ දැඩි කැපවීම දැනටමත් පෙන්නුම් කර ඇත. එසේ වුවද, ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යූහගත කිරීම සඳහා වන ඉලක්ක නියමිත පරිදි ළඟා කර ගැනීම සඳහා තිරසාර පදනමක් මත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කය සපුරා ගත හැකි වන පරිදි බදු ආදායම අඛණ්ඩව ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ. තවද, ප්‍රාථමික අතිරික්ත ඉලක්කය ළඟා කර ගැනීමේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රයත්නයන්හි සිදු වන යම් කිසි කිසියම් අඩුපාඩුවක්, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියේ දී අත්කර ගෙන ඇති සියුම් සමතුලිතතාවය අවදානමට ලක් කරනු ලබන අතර, කිසියම් රාජ්‍ය මූල්‍ය හිඟයක් සපුරාලීමෙහි අරමුණින් යුතුව තවදුරටත් දේශීය ණය ප්‍රතිව්‍යූහගත කිරීමක් අවශ්‍ය වුවහොත් එය රටේ මූල්‍ය ස්ථායීතාව දැඩි ලෙස අඩපණ කරනු ඇත.

බදු ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රගතිය සැළකීමේදී, අපේක්ෂිත ආදායම් ඉලක්ක සහ ප්‍රාථමික අතිරික්ත ඉලක්කය සපුරා ගැනීම සඳහා බදු පරිපාලන ක්‍රියාමාර්ග ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත. තිරසාර පදනමක් මත මෙම ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වුවහොත් මේ වන විටත් ශ්‍රී ලංකාව තුළ ආරම්භ වී ඇති ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ ක්‍රියාවලිය අනතුරෙහි හෙළනු ඇති අතර එය 2022 දී අත් දකින ලද අතිශය දුෂ්කර තත්ත්වයන්ට නැවතත් රට පත් වීමේ අවදානමක් ඇති කළ හැක.

# 2 වන පරිච්ඡේදය

# රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

## සමාලෝචනය

ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම වැඩිවීම හේතුවෙන්, 2023 වසරේ පළමු කාර්තුවේ ප්‍රාථමික ශේෂ ඉලක්කය වූ රු. බිලියන 56 ක ප්‍රාථමික හිඟය ඉක්මවා රු. බිලියන 48.3 ක ප්‍රාථමික අතිරික්තයක් රජය විසින් අත්කර ගන්නා ලදී. බදු පදනම පුළුල් කිරීමට හා බදු ව්‍යුහය ප්‍රගතිශීලී ලෙස සකස් කිරීමට කැපී පෙනෙන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පෙළක් 2022 ජුනි මස සිට හඳුන්වා දෙන ලදී. 2023 වසරේ පළමු මාස හතරේ දී වර්ධනය වූ ආදායම් කාර්යසාධනයට වරණීය සංස්ථාපිත බදු අනුපාත හා නිදහස් කිරීම් ඉවත් කිරීම, අනිවාර්ය අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද නැවත හඳුන්වා දීම, පුද්ගලික ආදායම් බදු හා එකතු කළ අගය මත බදු අනුපාත ඉහළ දැමීම ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, ඉහළ දේශීය උද්ධමනය, දුර්වල වූ දේශීය මුදල් ඒකකය, ඉහළ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල සහ අනම්‍ය රාජ්‍ය පුනරාවර්තන වියදම් මධ්‍යයේ රජයේ වියදම් සීමා කිරීම තවදුරටත් අභියෝගයක්ව පැවතිණ.

බදු ආදායම ඉහළ යාම හේතුවෙන්, මුළු රාජ්‍ය ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ ලැබූ රු. බිලියන 630.9 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 820.1 ක් දක්වා සියයට 30 කින් වර්ධනය වූ අතර, එය 2023 වසර සඳහා ඇස්තමේන්තු කළ රු. බිලියන 3,408.0 ක් වූ මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 24.1 ක ළඟා කර ගැනීමකි. එකතු කළ අගය මත බද්ද හා නිෂ්පාදන බදුවල ඉහළ කාර්යසාධනය සහ 2022 ඔක්තෝබර් මස හඳුන්වා දුන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම ප්‍රධාන වශයෙන්ම හේතු කොට ගෙන, 2023 වසරේ පළමු මාස හතර තුළ බදු ආදායම රු. බිලියන 742.6 ක් දක්වා සියයට 36.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, එය 2023 වසර සඳහා ඇස්තමේන්තු කළ රු. බිලියන 3,130.0 ක බදු ආදායමින් සියයට 23.7 ක ළඟා කර ගැනීමකි. කෙසේ වුවද, සෙස් බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද මගින් 2023 වසරේ පළමු මාස හතර තුළ ලද ආදායම 2022 වසරට සාපේක්ෂව අඩුවිය. 2022 වසරේ පළමු මාස හතර තුළ ලද රු. බිලියන 30 ක් වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභාංශ පැවරුම් නොලැබීම හේතුවෙන්, 2023 වසරේ පළමු මාස හතර තුළ ලද බදු නොවන ආදායම සියයට 11.2 කින් රු. බිලියන 77.5 ක් දක්වා අඩු විය. කෙසේ වුවද, 2023 අයවැය මගින් හඳුන්වාදුන් ගාස්තු හා අයකිරීම් සංශෝධනය හේතුවෙන් 2022 වසරේ දී පළමු මාස හතර තුළ වූ රු. බිලියන 22.9 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ගාස්තු හා අයකිරීම් මගින් ලද ආදායම රු. බිලියන 39.6 ක් දක්වා සියයට 73.4 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අනිවාර්යය කිරීම සමඟ, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මගින් ලද බදු ආදායමේ වැඩිවීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස හතර තුළ දී ලබාගත් රු. බිලියන 149.2 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ආදායම් බදු මගින් ලද ආදායම රු. බිලියන 191.8 ක් දක්වා සියයට 28.6 කින් වැඩි විය. අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මගින් ලද බදු ආදායම, 2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 7.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළදී රු. බිලියන 40.1 ක් දක්වා වැඩි විය. සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 30 ක් දක්වා වැඩි කිරීම සහ බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතරේ දී වාර්තා වූ රු. බිලියන 72.2 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 105.0 ක් දක්වා සැළකිය යුතු ලෙස වැඩි විය.

භාණ්ඩ හා සේවා මත බදු මගින් ලද ආදායම, 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 442.3 ක් දක්වා සියයට 64.2 කින් වැඩිවිය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු මගින් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 85.3 සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රුපියල් බිලියන 158.2 ක් දක්වා සියයට 85.4 කින් වැඩි විය. ආනයනය සීමා කිරීම පැවතිය ද, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හා ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ආනයන මගින් ලද එකතු කළ අගය මත බදු ආදායම ද රු. බිලියන 65.0 ක් දක්වා සියයට 27.9 කින් වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදන හා දුම්වැටි මත නිෂ්පාදන බදු ආදායම ඉහළ යාම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ නිෂ්පාදන බදු ආදායම ද රු. බිලියන 136.6 ක් දක්වා සියයට 11.7 කින් ඉහළ ගිය අතර සුරාබදු මගින් ලද ආදායම රු. බිලියන 58.2 දක්වා සියයට 2.2 කින් සුළු වශයෙන් අඩු විය.

රේගු ආනයන බද්ද හැර විදේශ වෙළඳාම මත බදු ව්‍යුහයේ සෑම බද්දකින්ම ලද ආදායම 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස හතර තුළ දී අඩු විය. විදේශ වෙළඳාම මත බදු මගින් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර වාර්තා වූ රු. බිලියන 125.2

සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 108.5 ක් දක්වා සියයට 13.3 කින් අඩු විය. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද හා සෙස් බද්ද මගින් ලද ආදායම පිළිවෙලින් රු. බිලියන 56.7 ක් දක්වා සියයට 9.5 කින් හා රු. බිලියන 16.7 ක් දක්වා සියයට 43.0 කින් අඩු වූ අතර, රේගු ආනයන බදු රු. බිලියන 20.3 ක් දක්වා සියයට 15.8 කින් වැඩි විය. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු හා සෙස් බදු වල කාර්ය සාධනයේ මෙම වෙනස් වීමට හේතු වූයේ ජාත්‍යන්තර වෙළඳාමට පවතින බාධක ඉවත් කිරීම හා ආර්ථික තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා පිළිවෙලින් අවුරුදු 5 ක හා 3 ක කාල සීමාවන් තුළ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද හා සෙස් බද්ද ක්‍රමිකව ඉවත් කිරීම සඳහා 2023 අයවැය මගින් හඳුන්වා දුන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වේ. ඒ අනුව, ඊට සමාන්තරව වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද හා සෙස් බද්ද ක්‍රමිකව ඉවත් කිරීම හේතුවෙන් රාජ්‍ය ආදායමට වන බලපෑම අවම කිරීම සඳහා රේගු ආනයන බදු අනුපාත සියයට 0, සියයට 15, හා සියයට 20 දක්වා සංශෝධනය කෙරුණි. වැඩිවන ජීවන වියදම මන්දගාමී කිරීම සඳහා වරින් වර අනුපාත අඩු කිරීම හේතුවෙන් 2023 පළමු මාස හතර තුළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම ද රු. බිලියන 14.9 ක් දක්වා සියයට 5.9 කින් අඩුවිය.

2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 1,155.2 ට සාපේක්ෂව, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රාජ්‍ය වියදම රු. බිලියන 1,645.6 ක් දක්වා සියයට 42.4 කින් වැඩි විය. පුනරාවර්තන වියදම, රු. බිලියන 1,485.0 ක් දක්වා සියයට 46.0 කින් වැඩි වූ අතර, ප්‍රග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 160.6 ක් දක්වා සියයට 16.0 කින් වැඩි විය. පොලී ගෙවීම්, විශ්‍රාම වැටුප් හා සුබසාධන වැඩසටහන් සඳහා ගෙවීම් ඉහළ යාම රජයේ වියදම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශ ණය මත පොලී ගෙවීම් සියයට 64.9 කින් පහත වැටුණු අතර, රජයේ ණය මත පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් දේශීය ණය මත පොලී ගෙවීම් සියයට 130.8 කින් වැඩිවිය. 2022 වසර අවසානයේදී රජයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් විශ්‍රාම යාම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ වැටුප් හා වේතන සඳහා වූ රජයේ වියදම් සියයට 4.0 කින් අඩු වූ අතර, ඒ හේතුව නිසාවෙන්ම විශ්‍රාම වැටුප් සඳහා වූ වියදම ද සියයට 6.3 කින් වැඩි විය. සමාජයේ වඩාත්ම අවදානමට ලක් විය හැකි පිරිස් සඳහා අතිරේක සහන ලබාදීමට ප්‍රතිපාදන වෙන් කිරීම හා "සමෘද්ධි" වැඩසටහනේ වියදම් වැඩිවීම හේතුවෙන් සුබසාධන වියදම් සියයට 38.3 කින් ඉහළ ගියේය.

**වගුව 2.1 : අයවැය සාරාංශය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. මිලියන

| අයිතමය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| ආදායම් හා ප්‍රදාන | **631,129** | **821,346** |
| ආදායම | **630,908** | **820,070** |
| බදු ආදායම | 543,649 | 742,578 |
| බදු නොවන ආදායම | 87,259 | 77,493 |
| ප්‍රදාන | 221 | 1,276 |
| වියදම | **1,155,229** | **1,645,602** |
| පුනරාවර්තන | **1,016,810** | **1,484,984** |
| පොලී ගෙවීම් | 426,786 | 818,969 |
| අනෙකුත් | 590,023 | 666,015 |
| රාජ්‍ය ආයෝජන | 140,999 | 177,903 |
| අනෙකුත් | -2,580 | -17,285 |
| ආදායම් අතිරික්තය (+)/ හිඟය (-) | **-385,902** | **-664,913** |
| සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය (-) | **-524,100** | **-824,256** |
| මූල්‍යනය | **524,100** | **824,256** |
| විදේශීය මූල්‍යනය | **-126,985** | **-77,498** |
| ණය ගැනීම් | 111,742 | 49,970 |
| ණය ආපසු ගෙවීම් | -238,727 | -127,468 |
| දේශීය මූල්‍යනය | **651,085** | **901,753** |
| ණය ගැනීම් | 3,564,527 | 6,045,994 |
| ණය ආපසු ගෙවීම් | -2,913,443 | -5,144,241 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 2.2 : ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත (වාර්ෂික) | තත්‍ය (තාවකාලික) | සාධනය (%) |
|---|---|---|---|
| **මුළු ආදායම** | **3,408** | **820** | **24.1** |
| බදු ආදායම | 3,130 | 743 | 23.7 |
| බදු නොවන ආදායම | 278 | 77 | 27.9 |
| **මුළු වියදම** | **5,819** | **1,646** | **28.3** |
| වර්තන වියදම | 4,609 | 1,485 | 32.2 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 1,210 | 161 | 13.3 |

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව 2.3 : ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | තත්‍ය (ජන. - අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| ආදායම් සහ ලාභ මත බදු | 912 | 192 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 553 | 158 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | – | 0.02 |
| සමාජ ආරක්ෂණ දායක බද්ද - දේශීය | 186 | 54 |
| **උප එකතුව** | **1,651** | **404** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | |
| ආනයන බදු | 80 | 20 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 355 | 65 |
| සමාජ ආරක්ෂණ දායක බද්ද - ආනයන | 64 | 15 |
| ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන | – | 0.1 |
| වරාය ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 220 | 57 |
| සෙස් ආනයන / අපනයන | 85 | 17 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 70 | 15 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 346 | 78 |
| දුම්වැටි | 140 | 43 |
| ඛනිජ තෙල් | 142 | 28 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 64 | 8 |
| **උප එකතුව** | **1,220** | **268** |
| **සුරා බදු දෙපාර්තමේන්තුව** | | |
| මත්පැන්/දුම්කොළ | 214 | 58 |
| **උප එකතුව** | **214** | **58** |
| **අනෙකුත්** | | |
| විදුලි සංදේශ බද්ද | 20 | 5 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 25 | 7 |
| **උප එකතුව** | **45** | **13** |
| **මුළු බදු ආදායම** | **3,130** | **743** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගුව **2.4 :** රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| අයිතමය | 2022 | 2023 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| බදු ආදායම | **543,649** | **742,578** | **36.6** |
| ආදායම් බදු | 149,163 | 191,768 | 28.6 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 180,090 | 314,848 | 74.8 |
| එකතු කළ අගය මත බදු | 85,314 | 158,181 | 85.4 |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | – | 54,396 | – |
| නිෂ්පාදන බදු | 94,726 | 102,246 | 7.9 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 50 | 24 | -51.5 |
| ආනයන මත පදනම් වූ බදු | 203,582 | 223,414 | 9.7 |
| රේගු බදු | 17,505 | 20,264 | 15.8 |
| එකතු කළ අගය මත බදු | 50,832 | 65,007 | 27.9 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 9 | 148 | 1,555.9 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 62,633 | 56,685 | -9.5 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 15,797 | 14,872 | -5.9 |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | – | 15,456 | – |
| නිෂ්පාදන බදු | 27,571 | 34,319 | 24.5 |
| සෙස් බදු | 29,235 | 16,663 | -43.0 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 10,814 | 12,548 | 16.0 |
| බදු නොවන ආදායම | **87,259** | **77,493** | **-11.2** |
| මුළු ආදායම | **630,908** | **820,070** | **30.0** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


## රාජ්‍ය ආදායම

ප්‍රධාන වශයෙන් බදු ආදායම රු. බිලියන 742.6 ක් දක්වා සියයට 36.6 කින් ඉහළ යාම හේතුවෙන් ප්‍රදාන හැර රජයේ මුළු ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 630.9 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 820.1 ක් දක්වා සියයට 30.0 කින් වැඩි විය. කෙසේ වෙතත්, බදු නොවන ආදායම රු. බිලියන 77.5 ක් දක්වා සියයට 11.2 කින් පහළ යන ලදී. 2023 වසරේ පළමු මාස හතර තුළ දී රජයේ ආදායම වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වූ රු. බිලියන 3,408 ට සාපේක්ෂව සියයට 24.1 ක ළඟා කර ගැනීමකි.

ආදායම් බද්දෙන් එකතු වූ ආදායම රු. බිලියන 191.8 ක් දක්වා සියයට 28.6 කින්, එකතු කළ අගය මත බද්දෙන් ලද අදායම රු. බිලියන 223.2 ක් දක්වා සියයට 63.9 කින්, සිගරට් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම රු. බිලියන 42.7 ක් දක්වා සියයට 29.6 කින් සහ ඛනිජ තෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම රු. බිලියන 27.8 ක් දක්වා සියයට 68.8 කින් ද සැළකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් බදු ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 543.6 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 742.6 ක් දක්වා සියයට 36.6 කින් වර්ධනය විය. තවද, 2023 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 69.9 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් එකතු වූ ආදායම ද මෙම වර්ධනයට දායක විය. 2023 වසරේ පළමු මාස හතර තුළ දී බදු ආදායම් එකතුව 2023 වසර සඳහා ඇස්තමේන්තුගත ආදායම වූ රු. බිලියන 3,130 න් සියයට 23.7 කි.

බදු නොවන ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 87.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 77.5 ක් දක්වා සියයට 11.2 කින් සැළකිය යුතු ලෙස අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පොළී ආදායමෙන් (සියයට 173.6 කින්) සහ දඩ, අය කිරීම් සහ ගාස්තුවලින් (සියයට 73.4 කින්) ආදායම වැඩිවීම මධ්‍යයේ වුවද, මහ බැංකුවේ ලාභ පැවරුම් නොලැබීම සහ ලාභ සහ ලාභාංශ (සියයට 16.1 කින්), කුලී (සියයට 40.6 කින්) සහ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් (සියයට 6.5 කින්) ආදායම් ලැබීම් අඩුවීමයි. 2023 වසරේ පළමු මාස හතර තුළ දී බදු නොවන ආදායම් එකතුව 2023 වසර සඳහා ඇස්තමේන්තුගත ආදායම වූ රු. බිලියන 278.0 න් සියයට 27.9 කි.

**2.1 රූප සටහන : රජයේ ආදායම් සංයුතිය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### බදු ආදායම

2023 වසරේ පළමු මාස හතර තුළ මුළු ආදායමෙන් සියයට 90.6 ක් වූ බදු ආදායම, 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 543.6 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 742.6 ක් දක්වා සියයට 36.6 කින් වර්ධනය විය. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 54.9 කින් ද, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් (APIT) ලද ආදායම සියයට 458.5 කින් ද, රඳවා ගැනීමේ බද්දෙන් (WHT) ලද ආදායම සියයට 605.8 කින් ද වැඩි වීම හේතුවෙන් ආදායම් බදු ආදායම රු. බිලියන 149.2 සිට රු. බිලියන 191.8 ක් දක්වා සියයට 28.6 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. තවද, 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 223.2 ක් ලෙස වාර්තා වූ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම ඉහළ යාම, බදු ආදායමේ වර්ධනයට සැළකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. මේ අතර, සමස්ත බදු ආදායමෙන් සියයට 74.2 ක් වන වක්‍ර බදු ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 394.5 ක සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 550.8 දක්වා සියයට 39.6 කින් ඉහළ යන ලදී.

### ආදායම් බදු

සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සහ රඳවා ගැනීමේ බදු (WHT) මඟින් ලද ඉහළ ආදායම් හේතුවෙන් ආදායම් බදු ආදායම 2022 වසරේ පළමු මාස හතරේ දී වූ රු. බිලියන 149.2 ට සාපේක්ෂව 2023 වසරේ දී රු. බිලියන 191.8 ක් දක්වා සියයට 28.6 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද/සේවා නියුක්ති ආදායම මත රඳවා ගැනීමේ බද්ද, තක්සේරු වර්ෂයකට රු. මිලියන 1.2 ක් වන බදු සහන සීමාව ඉක්මවන සියලුම බදු ගෙවන්නන්ට අනිවාර්යය කිරීම මෙයට හේතු විය. මීට සමගාමීව බදු අය කළ හැකි ආදායම මත වූ බදු අයකරනු ලබන ආදායම් කාණ්ඩ රු. මිලියන 3 සිට රු. 500,000 දක්වා අඩු කිරීම සහ උපරිම පුද්ගල ආදායම් බදු අනුපාතය සියයට 18 සිට සියයට 36 දක්වා වැඩි කරන අතර, පුද්ගල ආදායම් බදු සහනය ඉක්මවන සෑම රු. 500,000 ක් සඳහාම සියයට 6 සිට සියයට 36 දක්වා ප්‍රගතිශීලී අයුරින් වැඩි වන පරිදි බදු අනුපාත සංශෝධනය කරමින් ආදායම් බදු ව්‍යුහය සංශෝධනය කරන ලදී. නව සංශෝධනයට අනුව, 2023 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගල ආදායම් බදු සහන සීමාව තක්සේරු වර්ෂයකට රු. මිලියන 3 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කරන ලද අතර තක්සේරු වසරක් තුළ සිදු කරන ලද වියදම් සඳහා ලබා දී තිබූ රු. මිලියන 1.2 ක වියදම් සහනය ඉවත් කරන ලදී. මේ අතර, 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතය (CIT) සියයට 24 සිට සියයට 30 දක්වා වැඩි කරන ලද අතර මත්පැන්, දුම්කොළ, ඔට්ටු ඇල්ලීම සහ සූදු සඳහා වන සංස්ථාපිත අදායම් බද්ද සියයට 40 ලෙස නොවෙනස්ව පවත්වා ගනිමින් සහනදායී සංස්ථාපිත ආදායම් බදු අනුපාත ඉවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 72.2 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 111.8 ක් දක්වා සියයට 54.9 කින් වැඩි විය. අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ( APIT) ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 7.2 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 40.1 ක් දක්වා සියයට 458.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. මීට අමතරව, රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම ද රු. බිලියන 5.6 ක සිට රු. බිලියන 39.3 ක් දක්වා සියයට 605.8 කින් සැළකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, දේපළ වෙළඳාම් අංශයෙහි අඩු කාර්යසාධනයත් සමග ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. මිලියන 633 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 469 ක් දක්වා

වගුව **2.5 :** ආදායම් බදු කාර්යසාධනය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| බදු පදනම | 2022 | 2023 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 72,184 | 111,843 | 54.9 |
| උපයන විට ගෙවීම් | 7,177 | 40,082 | 458.5 |
| පොළී ආදායම මත බදු | 5,569 | 39,301 | 605.8 |
| ආර්ථික සේවා ගාස්තු | 127 | 63 | -50.7 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 633 | 469 | -25.9 |
| අධිභාර බද්ද | 59,586 | - | - |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 3,887 | 11 | -99.7 |
| එකතුව | **149,163** | **191,768** | **28.6** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### එකතු කළ අගය මත බද්ද

2023 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 24.6 ක් අත්කර ගනිමින්, එකතු කළ අගය මත බදු ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 136.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 223.2 ක් දක්වා සියයට 63.9 කින් වැඩි විය. 2023 වසරේ පළමු මාස හතර තුළ දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු ආදායම සියයට 85.4 කින් 158.2 ක් දක්වා වැඩි වූ අතර ආනයන මගින් ලද එකතු කළ අගය මත බදු ආදායම සියයට 27.9 කින් රු. බිලියන 65.0 ක් දක්වා වැඩිවිය. එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩු කිරීම, එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 8 සිට සියයට 15 දක්වා වැඩිකිරීම වැනි 2022 වසරේ මැද භාගයේ සිට හඳුන්වා

දෙන ලද ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ අත් කර ගත් එකතු කළ අගය මත බද්දෙහි ඉහළ ආදායම් කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 2.6 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. මිලියන

| බදු පදනම | 2022 | 2023 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| දේශීය | 85,314 | 158,181 | 85.4 |
| ආනයන | 50,832 | 65,007 | 27.9 |
| ආදායම | **136,146** | **223,189** | **63.9** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## නිෂ්පාදන / සුරා බද්ද

මත්පැන්, මෝටර් වාහන සහ අනෙකුත් නිෂ්පාදන බදු අයිතමවලින් ලද ආදායම පහත වැටුණ ද, ප්‍රධාන වශයෙන් සිගරට් සහ ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම වැඩිවීම හේතුවෙන් 2022 වසරේ පළමු මාස හතරේ වාර්තා වූ රු. බිලියන 122.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ලද නිෂ්පාදන බදු/සුරා බදු ආදායම රු. බිලියන 136.6 ක් දක්වා සියයට 11.7 කින් වැඩි විය. නිෂ්පාදන බදු/සුරා බදු ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී සමස්ත බදු ආදායමෙන් සියයට 18.4 කට සහ සමස්ත ආදායමෙන් සියයට 16.7 කට දායක වී ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 24.4 ක් ළඟා කර ගැනීමකි.

**වගුව 2.7 : නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. මිලියන

| බදු පදනම | 2022 | 2023 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| මත්පැන් | 59,473 | 58,158 | -2.2 |
| දුම්වැටි හා දුම්කොළ | 32,962 | 42,706 | 29.6 |
| මෝටර් වාහන | 11,125 | 6,559 | -41.0 |
| ඛනිජ තෙල් | 16,446 | 27,759 | 68.8 |
| අනෙකුත් | 2,291 | 1,382 | -39.7 |
| එකතුව | **122,297** | **136,564** | **11.7** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මත්පැන්වලින් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 59.5 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 58.2 දක්වා සියයට 2.2 කින් සුළු වශයෙන් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මත්පැන් නිෂ්පාදනය, 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 22.6 කින් නිරපේක්ෂ ලීටර් මිලියන 12.1 දක්වා අඩු වීම ය. ඒ අනුව සැර මත්පැන් ආදායම 2022 පළමු මාස හතර තුළ වූ රු. බිලියන 44.0 ට සාපේක්ෂව සියයට 9.8 කින් 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 39.7 දක්වා අඩු විය. එමෙන්ම, බීර වලින් එකතු කළ ආදායම 2022 පළමු මාස හතර තුළ වූ රු. බිලියන 17.9 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 17.5 දක්වා සියයට 2.4 කින් සුළු වශයෙන් අඩු විය. 2023 වසරේ මුල් මාස හතර තුළ සුරා බද්දෙන් ලද ආදායම 2023 වසරේ ඇස්තමේන්තුගත මුළු ආදායමෙන් සියයට 27.2 ක ළඟාකර ගැනීමකි.


කෙසේ වුවද, දිග මිලිමීටර 60 නොඉක්මවන සිගරට් ( උදා ; CAPSTAN ) හැරුණු කොට අනෙකුත් සියළුම වර්ගවල සිගරට්වල මිල සියයට 20 කින් වැඩි වීම හේතුවෙන්, සිගරට් තුළින් ලද ආදායම 2022 පළමු මාස හතරේ වූ රු. බිලියන 33.0 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 42.7 ක් දක්වා සියයට 29.6 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. දිග මිලිමීටර 60 නොඉක්මවන සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද සිගරට් 1,000 කට රු. 13,360 ක් දක්වා නැවත ගෙන එන ලදී. මෙමඟින් එම සිගරට් කාණ්ඩයේ සිගරට් අලෙවිය පහළ යන අතරම ආදායම සැළකිය යුතු ලෙස ඉහළ යාමට බලපා ඇත.

එමෙන්ම, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් භාණ්ඩාගාරය වෙත මාරු කරන ලද වගකීම් මූල්‍යයනය අවශ්‍ය බැවින් 2023 වසරේ දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.3 ක් ලබා ගැනීම සඳහා 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම වර්ගයේ පෙට්‍රල් සහ ඩීසල් ආනයන මත නිෂ්පාදන බද්ද රු. 25 කින් ඉහළ නැංවීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2022 පළමු මාස හතරේ වූ රු. බිලියන 16.4 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 27.8 දක්වා සියයට 68.8 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

2020 වසරේ මාර්තු මස සිට අත්‍යාවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ගවල එක් අංගයක් ලෙස මෝටර් රථ ආනයනය සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බද්ද 2022 පළමු මාස හතරේ රු. බිලියන 11.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 6.6 ක් දක්වා සියයට 41.0 කින් සැළකිය යුතු ලෙස අඩු විය.

මේ අතර, අත්‍යාවශ්‍ය නොවන නිෂ්පාදන සඳහා පනවා ඇති ආනයන සීමා කිරීම්වල බලපෑම පිළිබිඹු කරමින් පැණි බීම, ශීතකරණ, පාම් ඔයිල් සහ මේද අම්ල වැනි අනෙකුත් නිෂ්පාදන බදු අය කල යුතු අයිතම මගින් උපයන ලද නිෂ්පාදන බදු ආදායම 2022 පළමු මාස හතරේ වූ රු. බිලියන 2.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 1.4 දක්වා සියයට 39.7 කින් අඩු වී ඇත.

2.2 රූපසටහන : නිෂ්පාදන බදු කාර්යසාධනය 2022 සහ 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා




මූලාශ්‍රයඃ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### වෙනත් බදු

රේගු ආනයන බද්දෙන් සහ විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වැඩි වූ අතර වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සහ සෙස් බද්දෙන් උපයන ලද ආදායම 2022 වසරේ සමාන කාල සීමාවට සාපේක්ෂව අඩු විය. සමස්තයක් ලෙස ආනයන පහළ යාම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 62.6 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 56.7 ක් දක්වා සියයට 9.5 කින් අඩු විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 220 න් සියයට 25.8 ක ළඟාකර ගැනීමකි. මේ අතර 2023 වසරේ මාර්තු මස සම්මත රේගු ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15 සහ සියයට 20 දක්වා ඉහළ නැංවීම මෙන්ම තිරිගු මත වූ තීරු බදු සහනය ඉවත් කිරීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2022 වසරේ පළමු මාස හතරේ වූ රු. බිලියන 17.5 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 20.3 ක් දක්වා සියයට 15.8 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, සමස්තයක් ලෙස අත්‍යවශ්‍ය අහාර ආනයන පහළ යාම, වෙළෙඳ භාණ්ඩ මත නාමික විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත පවත්වාගෙන යාම මෙන්ම බඩ ඉරිඟු මත පනවා තිබූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම හේතු කොට ගෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද ආදායම රු. බිලියන 14.9 ක් දක්වා සියයට 5.9 කින් අඩු විය. 2023 වසරේ පළමු මාස හතර තුළ දී විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම රු. බිලියන 5.3 ක් දක්වා සියයට 25 කින් සැළකිය යුතු ලෙස වැඩි වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2022 වසරේ ජූනි මාසයේ විදුලි සංදේශ බදු අනුපාත ඉහළ නැංවීමයි. තෝරාගත් ආනයන මත ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම මඟින් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයන සීමා කිරීම සඳහා රජය අනුගමනය කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ආනයන පහත වැටීමෙන්, සෙස් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 29.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 16.7 දක්වා සියයට 43.0 කින් අඩු විය. ඒ අනුව, ආනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 28.5 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 16.0 දක්වා සියයට 44 කින් සැළකිය යුතු ලෙස අඩු විය. මේ අතර, අපනයන මත සෙස් බදු ආදායම විනිමය අනුපාත පහත වැටීමේ බලපෑම හේතුවෙන් 2022 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 0.69 සිට 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 0.7 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් වැඩි විය. 2023 වසරේ පළමු මාස හතර තුළ දී සෙස් බද්දෙන් ලද ආදායම 2023 වසර සඳහා ඇස්තමේන්තුගත ආදායම වූ රු. බිලියන 85.0 න් සියයට 19.6 කි.

### බදු නොවන අදායම

2022 වසරේ පළමු මාස හතර තුළ ලද රු. බිලියන 30.0 ට සාපේක්ෂව මහ බැංකු ලාභ පැවරුම් නොලැබීම ප්‍රධාන වශයෙන්ම හේතු කොට ගෙන, බදු නොවන ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 87.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 77.5 ක් දක්වා සියයට 11.2 කින් අඩු විය. රාජ්‍ය ව්‍යාපාර මඟින් ලැබූ ලාභ හා ලාභාංශ 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 11.4 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 9.6 ක් දක්වා සියයට 16.1 කින් අඩු වූ අතර, 2023 වසරේ පළමු මාස හතර තුළ දී සමාජ ආරක්ෂණ දායකත්ව මඟින් ලද ආදායම රු. බිලියන 11.3 ක් දක්වා සියයට 6.5 කින් අඩු විය. කුලී ආදායමෙන් ලද අදායම 2022 වසරේ පළමු මාස හතරේ දී වූ රු. බිලියන 2.2 සිට 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 1.3 ක් දක්වා සියයට 40.6 කින් සැළකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, පොළී ආදායම 2022 වසරේ පළමු මාස හතරේ දී වූ රු. බිලියන 1.1 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 3.0 ක් දක්වා සියයට 173.6 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. ගමන් බලපත්‍ර ගාස්තු, වීසා ගාස්තු, වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ ආදායම් බලපත්‍ර ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් දඩ සහ ගාස්තු මඟින් ලද ආදායම ද 2022 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 22.9 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 39.6 ක් දක්වා සියයට 73.4 කින් කැපී පෙනෙන ලෙස ඉහළ යන ලදී. 2023 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම ඇස්තමේන්තුගත වාර්ෂික බදු නොවන ආදායමෙන් සියයට 27.9 කි.

2.8 වගුව : රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය

රු. බිලියන

| අයිතමය | 2022 ජන - අප්‍රේල් | 2023 ඇස්ත. | 2023 ජන - අප්‍රේල් (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 149.2 | 912.0 | 191.8 | 2023 වසරේ පළමු මාස හතර තුළ දී ආදායම් බදු වලින් ලද ආදායම 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 191.8 ක් දක්වා සියයට 28.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 21 ක ළඟාකර ගැනීමකි. පුද්ගල ආදායම් බදු අනුපාතය සියයට 6 සිට සියයට 36 දක්වා ප්‍රගතිශීලී ලෙස සංශෝධනය කිරීම, උපරිම පුද්ගල ආදායම් බදු අනුපාතය සියයට 18 සිට සියයට 36 දක්වා වැඩි කිරීම, සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 24 සිට සියයට 30 දක්වා වැඩි කිරීම හේතුවෙන් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම වැඩි වීම, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ආදායම (APIT) සහ රඳවා ගැනීමේ බදු (WHT) ආදායම වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. එසේම, සලකා බලන කාලපරිච්ඡේදයේ දී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම රු. බිලියන 111.8 දක්වා සියයට 54.9 කින් ද, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ආදායම රු. බිලියන 40.1 දක්වා සියයට 458.5 කින් ද වැඩි විය, රඳවා ගැනීමේ බදු ආදායම රු. බිලියන 39.3 දක්වා සියයට 605.8 කින් සැලකියයුතු ලෙස වර්ධනය විය. කෙසේ නමුත්, දේපල වෙළඳාම් අංශයේ දුර්වල කාර්යයසාධනය හේතුවෙන් අදාල කාලපරිච්ඡේදයේ ප්‍රාග්ධන ලාභ මත බදු ආදායම රු. මිලියන 469 දක්වා සියයට 25.9 කින් පහල වැටුණි. |
| එකතු කළ අගය මත බද්ද | 136.1 | 908.0 | 223.2 | 2023 වසරේ පළමු මාස හතර තුළ දී එකතු කළ අගය මත බදු ආදායම (VAT) 2022 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 223.2 දක්වා සියයට 63.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේතුවෙන් සියයට 24.6 ක ළඟාකර ගැනීමකි. 2022 වසරේ මැද භාගයේ දී වැට් බදු අනුපාතය සියයට 8 සිට සියයට 15 දක්වා වැඩි කිරීම සහ වැට් බදු ලියාපදිංචි කිරීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩු කිරීම වැනි ප්‍රතිපත්තිමය සංශෝධන මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපර්ච්ඡේදයේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මත වැට් බදු ආදායම සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මත වැට් බදු ආදායම පිළිවෙලින් රු. බිලියන 158.2 දක්වා සියයට 85.4 කින් සහ රු. බිලියන 65 දක්වා සියයට 27.9 කින් ද වර්ධනය විය. |
| නිෂ්පාදන බද්ද/ සුරා බද්ද | 122.3 | 560.0 | 136.6 | 2023 වසරේ පළමු මාස හතර තුළ නිෂ්පාදන බදු තුළින් ලද ආදායම, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 136.6 දක්වා සියයට 11.7 කින් වර්ධනය විය. එය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 24.4 ක ළඟා කර ගැනීමකි. මද්‍යසාර, මෝටර් වාහන සහ අනෙකුත් නිෂ්පාදන බදු අයිතම වලින් ලද ආදායම පහත වැටුණද, ප්‍රධාන වශයෙන් සිගරට් සහ ඛනිජ තෙල් නිෂ්පාදන මත ලද ආදායම වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. දුම්වැටි මත නිෂ්පාදන බදු ඉහළ දැමීම හේතුවෙන් නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 42.7 දක්වා සියයට 29.6 කින් වර්ධනය විය. |

රු. බිලියන

| අයිතමය | 2022 ජන - අප්‍රේල් | 2023 ඇස්ත. | 2023 ජන - අප්‍රේල් (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|
| | | | | සියලුම වර්ගයේ පෙට්‍රල් සහ ඩීසල් මත නිෂ්පාදන බද්ද රු. 25 කින් ඉහළ නැංවීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත ආදායම රු. බිලියන 27.8 දක්වා සියයට 68.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වුවද, මත්පැන් නිෂ්පාදනය පහළ යාම හේතුවෙන් සුරාබදු ආදායම රු. බිලියන 58.2 දක්වා සියයට 2.2 කින් ආන්තිකව පහළ වැටුණි. අනෙකුත් නිෂ්පාදන බදු වලින් ලැබෙන නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 1.4 දක්වා සියයට 39.7 කින් පහත වැටුණු අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 23 ක ළඟාකර ගැනීමකි. |
| ආනයන බද්ද | 17.5 | 80.0 | 20.3 | ආනයන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 25.3 ක් ළඟාකර ගනිමින්, 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 20.3 දක්වා සියයට 15.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වර්ෂයේ මාර්තු මාසයේ දී තිරිඟුපිටි සඳහා පනවා තිබූ තීරු බදු සහනය ඉවත් කිරීමත්, තීරුබදු අනුපාත සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15 සහ සියයට 20 දක්වා 2023 වසරේ මාර්තු මාසයේ වැඩි කිරීමත් මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 62.6 | 220.0 | 56.7 | සමස්ථ ආනයන පහළ යාම හේතුවෙන් 2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 62.6 ට සාපේක්ෂව වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු මගින් ලද ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සාපේක්ෂව රු. බිලියන 56.7 දක්වා සියයට 9.5 කින් අඩු වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 25.8 ක ළඟා කර ගැනීමකි. |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | 15.8 | 70.0 | 14.9 | 2022 වසරේ පළමු මාස හතරේ වූ රු. බිලියන 15.8 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම රු. බිලියන 14.9 ක් දක්වා සියයට 5.9 කින් පහත වැටුණු අතර එය 2023 වසරේ වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 21.2 ක ළඟා කර ගැනීමකි. සමස්ථ අත්‍යාවශ්‍යය ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු වීම, අත්‍යාවශ්‍යය භාණ්ඩ මත නාමික විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත පවත්වා ගෙන යාම, බඩ ඉරිඟු මත පැවති විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ඉවත් කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. |
| වෙනත් බදු | 40.1 | 380.0 | 99.2 | පසුගිය වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 40.1 ක ආදායමට සාපේක්ෂව අනෙකුත් බදු වලින් ලද ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 99.2 දක්වා සියයට 147.4 කින් වර්ධනය වූ අතර එය 2023 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 26.1ක ළඟාකර ගැනීමකි. 2023 වසරේ පළමු මාස හතර තුළ දී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මත රු. බිලියන 69.9 ක ආදායමක් ලැබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. අත්‍යාවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයන සීමා කිරීම සඳහා රජය ගෙන ඇති ප්‍රතිපත්ති හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ සෙස් බදු ආදායම රු. බිලියන 16.7 දක්වා සියයට 43.0 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, විදුලි සංදේශ බද්ද 2022 වසරේ ජුනි මස සිට ඉහළ දැමීම හේතුවෙන් විදුලි සංදේශ බදු ආදායම 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ දී රු. බිලියන 5.3 දක්වා සියයට 25 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. |

රු. බිලියන

| අයිතමය | 2022 ජන - අප්‍රේල් | 2023 ඇස්ත. | 2023 ජන - අප්‍රේල් (තාවකාලික) | හේතු |
|---|---|---|---|---|
| බදු නොවන ආදායම | 87.3 | 278.0 | 77.5 | මහ බැංකු ලාභ පැවරුම්, ලාභ සහ ලාභාංශ, කුලී සහ සමාජ ආරක්ෂණ දායකත්ව අඩු වීම හේතුවෙන් බදු නොවන ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 87.3 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 77.5 ක් දක්වා සියයට 11.2 කින් අඩු වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 27.9ක ළඟාකර ගැනීමකි. කෙසේ වුවත්, 2022 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ තුළ දී පොළී ආදායම රු. බිලියන 3.1 ක් දක්වා සියයට 173.6 කින් සහ දඩ, ගාස්තු රු. බිලියන 39.6 දක්වා සියයට 73.4 කින් කැපී පෙනෙන ලෙස ඉහළ යන ලදී. තවද, අනෙකුත් බදු නොවන ආදායම 2023 වසරේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා රු. බිලියන 12.6 ක ආදායමක් වාර්තා කළ අතර, එය 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 66.7 ක වර්ධනයකි. |
| **එකතුව** | **630.9** | **3,408.0** | **820.1** | |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 2.1 - ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2023 වසරේ ජනවාරි සිට ජූනි දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය<br>- 2022 අතුරු අයවැයේ යෝජනා කර ඇති පරිදි , වාර්ෂික ආදායම සහ බදු නිදහස් සීමාවන් නොසලකා වයස අවුරුදු 18 ට වැඩි සියලුම වාසික පුද්ගලයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනිවාර්ය බදු ලියාපදිංචිය හඳුන්වා දීම. |
| **2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2023.01.01 | **පුද්ගල ආදායම් බද්ද** |
| | **වාර්ෂික බදු ආදායම** |
| | මූලික රු. 1,200,000 - නිදහස්<br>රු. 500,000 - රු. 1,000,000 - 6 %<br>රු. 1,000,000 - රු. 1,500,000 - 12 %<br>රු. 1,500,000 - රු. 2,000,000 - 18 %<br>රු. 2,500,000 - රු. 3,000,000 - 24 %<br>රු. 3,000,000 - රු. 3,500,000 - 30 %<br>රු. 3,500,000 ට වැඩි - 36 % |
| 2023.01.01 | **රඳවාගැනීමේ බද්ද** |
| | **රඳවාගැනීමේ බදු අනුපාත** |
| | ලාභාංශ - 15 %<br>පොලිය හෝ වට්ටම් - 5 %<br>මසකට රු. 100,000 ඉක්මවන කුලීගෙවීම් - 10 %<br>මසකට රු. 100,000 ඉක්මවන සේවා ගෙවීම් - 5 %<br>අනෙකුත් සියළු අවස්ථා - 14 % |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2023.01.01 | 2022 අංක 44 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br>- සහාධිපත්‍ය නේවාසික මහල් නිවාස මත එකතු කළ අගය මත බදු නිදහස් කිරීම ඉවත් කිරීම. |
| **1989 අංක 13 දරන නිෂ්පාදන බදු විශේෂ (විධිවිධාන) පනත** | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/68 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව, හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන නිෂ්පාදන බදු නියම කිරීම.<br>- ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට.<br>- දුම්වැටි සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට. |

| | |
|---|---|
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/23 දරන ගැසට් නිවේදනය<br>- ඉන්ධන (පෙට්‍රල් සහ ඩීසල්) මත වන නිෂ්පාදන බදු අනුපාතය ලීටරයකට රු. 25 කින් වැඩිකිරීම. |
| 2023.06.17 | 2023.06.16 දිනැති අංක 2336/69 දරන ගැසට් නිවේදනය<br>- පැල්මිටික් අම්ලය (HS කේත 2915.70.10) සහ ලෝරික් අම්ලය( HS කේත 2915.90.10) සඳහා CIF අගයෙන් 29% ක නිෂ්පාදන බදු අනුපාතයක් පැනවීම. |
| සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය) | |
| 2023.01.03 | සුරාබදු නිවේදන අංක 07/2022 ( 2022.12.31 දිනැති අංක 2312/70 දරන ගැසට් නිවේදනය)<br>- මත්පැන් මත සුරා බද්ද වැඩිකිරීම. |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/71 දරන ගැසට් නිවේදනය<br>- 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත යටතේ බීඩියක් මත රුපියල් දෙකක බද්දක් පැනවීම. |
| 2023.06.17 | සුරාබදු නිවේදන අංක 01/2023 ( 2023.06.16 දිනැති අංක 2336/70 දරන ගැසට් නිවේදනය)<br>- බලපත්‍ර සහිතව හෝ රහිතව සන්තකයේ තබාගත හැකි අයිසො ප්‍රොපයිල් (Isopropyl) මධ්‍යසාරවල වර්තමාන සීමාවන් වැඩි කිරීම. |
| රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය) | |
| 2023.01.05 | 2023.01.04 දිනැති අංක 2313/35 දරන ගැසට් නිවේදනය<br>- 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම. |
| 2023.06.01 | 2023.05.31 දිනැති අංක 2334/28 දරන ගැසට් නිවේදනය<br>- 2023 දෙසැම්බර් 31 දක්වා තවත් මාස හයක කාලයක් සඳහා තෝරාගත් භාණ්ඩ සඳහා රේගු ආනයන බද්දේ ප්‍රතිශතයක් ලෙස අධිභාරය දිගටම පවත්වාගෙන යෑම සඳහා 2022.11.30 දිනැති අංක 2308/16 දරන ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීම. |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/67 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නියම කිරීම. |
| 2023.04.04 | 2023.04.03 දිනැති අංක 2326/02 දරන ගැසට් නිවේදනය<br>- අයවැය 2023 හි යෝජනාවට අනුව වසර පහක් තුල වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස 1631 තීරුබදු අයිතම මත අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නිදහස් කිරීම. |
| සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | |
| 2023.01.01 | 2023.01.01 දිනැති අංක 2312/76 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සෙස් බද්ද නියම කිරීම. |
| 2023.01.31 | 2023.01.26 දිනැති අංක 2316/32 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ කොටස් වෙළඳපොල හරහා ආයතනික ණය සුරැකුම්පත් වල නැවත මිලදී ගැනීමේ ගණුදෙනු සඳහා 0.006 % ක සෙස් බද්දක් පැනවීම. |
| 2023.03.29 | 2023.03.28 දිනැති අංක 2325/06 දරන ගැසට් නිවේදනය<br>- 2023 අයවැයෙන් යෝජනා කර ඇති පරිදි වසර තුනක් ඇතුළත සෙස් බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස සංයෝජිත සංකේතාංක කේත 8155 කින් සංයෝජිත සංකේතාංක කේත 2668 ක සෙස් බද්ද අඩු කිරීම. |
| 2023.06.17 | 2023.06.16 දිනැති අංක 2336/71 දරන ගැසට් නිවේදනය<br>- පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය මත සෙස් බද්ද වැඩි කිරීම සහ ක්ලින්කර් ආනයනය මත කිලෝග්‍රෑමයකට රු. 1/- ක සෙස් බද්දක් පැනවීම. |
| රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත | |
| 2023.01.01 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 07/2022 (2023.01.01 දිනැති අංක 2312/75 දරන ගැසට් නිවේදනය)<br>- ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීම සඳහා සෑම වසර 05කට වරක්ම රේගු සංයෝජිත සංකේතාංක යාවත්කාලීන කිරීම. ශ්‍රී ලංකාවේ ඉලක්කම් අටකින් යුතු රේගු සංකේතාංක 7,842 ක් ඇත. කෙසේ වුවත්, 2022 සංස්කරණය මගින් එම රේගු සංකේතාංක සංඛ්‍යාව 8,155 ක් දක්වා වැඩි වී ඇත. |

| | |
|---|---|
| 2023.03.29 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2023 (2023.03.28 දිනැති අංක 2325/07 දරන ගැසට් නිවේදනය)<br>- 0%, 10% සහ 15% සිට 0%, 15%, 20% දක්වා රේගු ආනයන බදු අනුපාත සංශෝධනය කිරීම මගින් සෙස් බද්ද සියයට 20 කින් අඩු කිරීම සලකා ආදායම් මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම සඳහා නිශ්චිත අයිතම සඳහා රේගු ආනයන බදු අනුපාතය වැඩි කිරීම. |
| 2023.06.17 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2023 (2023.06.16 දිනැති අංක 2336/72 දරන ගැසට් නිවේදනය)<br>- දේශීය රූපලාවන්‍ය කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා පාම් ඔයිල් මේද අම්ලයේ තීරුබදු ව්‍යුහයට සමාන තීරුබදු ව්‍යුහයක් පැනවීම සහ පැල්මිටික් අම්ලය සහ ලෝරික් අම්ලය සඳහා නව සංයෝජිත සංකේතාංක කේතයන් (ජාතික උපබෙදුම්) නිර්මාණය කිරීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2023.01.05 | 2023.01.04 දිනැති අංක 2313/34 දරන ගැසට් නිවේදනය<br>- 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම. |
| 2023.01.26 | 2023.01.25 දිනැති අංක 2316/28 දරන ගැසට් නිවේදනය<br>- දේශීය සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය ඇතිව 2023 ජනවාරි 15 හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපලවල බඩඉරිඟු තොග ගෙනඒමට යටත්ව සහනය දීර්ඝ කිරීම. |
| 2023.02.21 | 2023.02.20 දිනැති අංක 2320/04 දරන ගැසට් නිවේදනය<br>- බිත්තර ආනයනයේදී බිත්තරයකට රුපියල් 50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හඳුන්වා දීම සහ බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීම සඳහා රාජ්‍ය වෙළඳ සහයෝගීතාව සඳහා බිත්තරයකට රු. 1/- ක සහන මිලක් ලබා දීම. |
| 2023.03.04 | 2022.03.04 දිනැති අංක 2321/76 දරන ගැසට් නිවේදනය<br>- දේශීය ගොවීන් සඳහා වඩා හොඳ මිලක් සහතික කිරීම පිණිස, කළු ඇට, කව්පි, කුරක්කන් සහ අනෙකුත් මෙනේරි සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම. |
| 2023.03.08 | 2023.03.07 දිනැති අංක 2322/20 දරන ගැසට් නිවේදනය<br>- දේශීය ගොවීන්ගේ අස්වැන්න සඳහා සාධාරණ වෙළඳපල මිලක් සහතික කිරීම මගින් ඔවුන් දිරිමත් කිරීම පිණිස විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු.50/- ක් වැඩි කිරීම. |
| 2023.03.08 | 2023.03.07 දිනැති අංක 2322/21 දරන ගැසට් නිවේදනය<br>- රාමසාන් උත්සව සමය නිමිත්තෙන් කිසිදු විදේශ විනිමය පදනමක් නොමැතිව පරිත්‍යාග හෝ තෑගි වශයෙන් ලැබෙන රට ඉඳි ආනයනය කිරීම සඳහා පමණක් කිලෝවකට රුපියලක සහනයක් සැලසීම. |
| 2023.03.18 | 2023.03.17 දිනැති අංක 2323/40 දරන ගැසට් නිවේදනය<br>- වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු. 200/ ක සහනදායී මිලක් අය කිරීම. |
| 2023.05.18 | 2023.05.17 දිනැති අංක 2332/14 දරන ගැසට් නිවේදනය<br>- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු. 50/-ක බදු සහනයක් සැලසීම, බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු. 75/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම, සහල් ආනයනය මත කිලෝවකට ශත 25 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම මත රුපියල් 65 දක්වා වැඩි කිරීම සහ වලංගු කාලය දීර්ඝ කිරීම සහ අනෙකුත් භාණ්ඩ 34 ක වලංගු කාලය එම තීරු බදු අනුපාතය ලෙස දීර්ඝ කිරීම. |
| 2023.05.21 | 2023.05.20 දිනැති අංක 2332/53 දරන ගැසට් නිවේදනය<br>- බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීම සඳහා රාජ්‍ය වෙළඳ සහයෝගීතාව සඳහා බිත්තරයකට රු. 1/-ක සහනදායී මිලක් ලබා දීම සහ බිත්තර ආනයනය කිරීමේදී බිත්තරයකට රු. 50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2023.06.23 | 2023.06.22 දිනැති අංක 2337/16 දරන ගැසට් නිවේදනය<br>- ආහාර ප්‍රතිපත්ති කමිටුවේ තීරණය සලකා බලා, වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු. 200/- ක සහනදායී මිලක් අය කිරීම.<br>- සෙයිල් මාළු, මාර්ලින් මාළු සහ ක්වීන් මාළු වැනි මත්ස්‍ය ප්‍රභේද ආනයනය කිරීමේදී කිලෝග්‍රෑමයකට රුපියල් 275 ක සහනදායී මිලක් ලබාදීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2023.01.01 | 2023 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/77 දරන ගැසට් නිවේදනය)<br>- ආනයන පාලන බලපත්‍ර ඒකාබද්ධ කිරීම. |

| | |
|---|---|
| 2023.01.01 | 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/78 දරන ගැසට් නිවේදනය)<br>- තාවකාලික අත්හිටුවීම ඒකාබද්ධ කිරීම. |
| 2023.01.19 | 2023 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.19 දිනැති අංක 2315/46 දරන ගැසට් නිවේදනය)<br>- ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.02.22 | 2023 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/46 දරන ගැසට් නිවේදනය)<br>- ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.02.22 | 2023 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/47 දරන ගැසට් නිවේදනය<br>- ආනයන සහ අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.03.24 | 2023 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.03.24 දිනැති අංක 2324/45 දරන ගැසට් නිවේදනය)<br>- පිටාර විමෝචනය සහ ආරක්ෂක පියවරයන්/ සම්මත රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.04.06 | 2023 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/40 දරන ගැසට් නිවේදනය)<br>- ගෙවීම් නියමයන් මත ආනයන අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම. |
| 2023.06.01 | 2023 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/41 දරන ගැසට් නිවේදනය)<br>- තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය සඳහා රෙගුලාසි පැනවීම. |
| 2023.06.10 | 2023 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.06.09 දිනැති අංක 2335/26 දරන ගැසට් නිවේදනය)<br>- තාවකාලික අත්හිටුවීම ඒකාබද්ධ කිරීම සහ 2023.01.01 දින අංක 2312/78 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීම. |
| **2003 අංක 25 දරන මුදල් පනත** | |
| අපගමන බද්ද | |
| 2023.01.12 | 2023.01.11 දිනැති අංක 2314/16 දරන ගැසට් නිවේදනය<br>- අපගමන බද්ද පනවන ලද 2003 වසරේ සිට මෙතෙක් නැව් මගින් පිටත්වන මගීන්ගෙන් අපගමන බද්ද අය කිරීමට නියමයන් පනවා නැත. එබැවින්, ගුවන් යානයකින් මෙන්ම නැවකින් ද ශ්‍රී ලංකාවෙන් පිටත්වන මගීන් සඳහා අපගමන බද්ද අයකිරීමට රෙගුලාසි හඳුන්වා දී ඇත. |
| 2023.04.25 | 2023.04.25 දිනැති අංක 2329/19 දරන ගැසට් නිවේදනය<br>- 2023.11.11 දිනැති අංක 2314/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයේ I සටහනේ අංක ii අයිතමය සංශෝධනය කිරීම. |
| **2004 අංක 11 දරන මුදල් පනත - ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද** | |
| 2023.01.01 | 2023.01.01 දිනැති අංක 2312/80 දරන ගැසට් නිවේදනය<br>- පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක (STN) මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු (ILAC) , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) සඳහා ගෙවිය යුතු බදු අනුපාතය 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීම. |
| **2018 අංක 35 දරන මුදල් පනත - මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බද්ද** | |
| 2023.01.01 | 2022.12.31 දිනැති අංක 2312/69 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව, හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සුඛෝපභෝගී බද්ද නියම කිරීම. |
| 2023.02.10 | 2023.02.10 දිනැති අංක 2318/53 දරන ගැසට් නිවේදනය<br>- සංක්‍රමණික සේවකයන් ආනයනය කරනු ලබන පූර්ණ විදුලි මෝටර් රථ සඳහා බදු රහිත සීමාව රු. මිලියන 6 සිට මිලියන 12ක් දක්වා ඉහල නැංවීම. |
| 2023.05.31 | 2023.05.31 දිනැති අංක 2334/24 දරන ගැසට් නිවේදනය<br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි (LC) පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 12 දක්වා වැඩි කිරීම.) |

### රාජ්‍ය වියදම

2022 වසරේ අනුරූපී කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ වියදම වන රු. බිලියන 1,155.2 හා සැසඳීමේ දී 2023 වසරේ පළමු මාස හතර තුළ රජයේ මුළු වියදම රු. බිලියන 1,645.6 ක් දක්වා සියයට 42.4 ක වැඩිවීමක් වාර්තා විය. පොළී ගෙවීම, විශ්‍රාම වැටුප් ගෙවීම සහ සහනාධාරය සඳහා වූ වියදම වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වෙමින් 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 1,016.8 හා සැසඳීමේදී 2023 වසරේ පළමු මාස හතර සඳහා පුනරාවර්තන වියදම රු. බිලියන 1,485.0 දක්වා සියයට 46.0 කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 138.4 හා සැසඳීමේදී 2023 වසරේ පළමු මාස හතර තුළ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් සඳහා වියදම රු. බිලියන 160.6 දක්වා සියයට 16.0 කින් පමණ ඉහළ ගොස් ඇත.

**2.9 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ වියදම් කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | **1,016,810** | **1,484,984** |
| පුද්ගල පඩිනඩි | 316,051 | 303,310 |
| විශ්‍රාම වැටුප් | 99,659 | 105,924 |
| පොළී ගෙවීම් | 426,786 | 818,969 |
| වෙනත් | 174,313 | 256,781 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | **138,419** | **160,618** |
| එකතුව | **1,155,229** | **1,645,602** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### පොළී ගෙවීම්

2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 426.8 හා සැසඳීමේදී 2023 වසරේ පළමු මාස හතර තුළ දේශීය හා විදේශීය ණය ඇතුළත් ව පොළී ගෙවීම සඳහා මුළු වියදම රු. බිලියන 819.0 දක්වා සියයට 91.9 කින් පමණ ඉහළ ගොස් ඇත. 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 84.9 හා සැසඳීමේ දී 2023 වසරේ පළමු මාස හතර තුළ විදේශ ණය සඳහා පොළී ගෙවීම් රු. බිලියන 29.8 දක්වා සියයට 64.9 කින් පමණ පහළ ගොස් ඇති අතර 2022 පළමු මාස හතර තුළදී රු. බිලියන 341.9 ක් වූ දේශීය ණය සඳහා පොළී ගෙවීම් 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 789.1 දක්වා සියයට 130.8 කින් ඉහළ ගොස් ඇත.

### වැටුප් සහ විශ්‍රාම වැටුප්

පළාත් සභා ඇතුළුව රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා වේතන සඳහා 2023 වර්ෂයේ පළමු මාස හතරක කාලය තුලදී රුපියල් බිලියන 303.3 ක වියදමක් දරා ඇති අතර 2022 වසරේ සමාන කාලසීමාව තුළ දරන ලද රු.බිලියන 316.1 ට සාපේක්ෂව එය සියයට 4 ක අඩුවීමකි. 2022 වර්ෂය අවසානයේ විශ්‍රාමිකයන් සංඛ්‍යාව වැඩිවීම, අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වා සංශෝධනය කිරීමත් සමඟ රාජ්‍ය අංශයට බඳවා ගැනීම් අත්හිටුවීම නිසා මෙම පහත වැටීම සිදු වී ඇත. කෙසේ වුවද, 2023 වසරේ පළමු මාස හතර තුළ විශ්‍රාම වැටුප් සඳහා රු.බිලියන 105.9 ක වියදමක් දරා ඇති අතර, එය 2022 වසරේ සමාන කාලසීමාව තුල දරන ලද රු.බිලියන 99.7 ට සාපේක්ෂව සියයට 6.3 ක වර්ධනයකි.

### සුබසාධන වියදම්

2023 වසරේ මුල් මාස හතර තුළ "සමෘද්ධි" ගෙවීම්, වැඩිහිටි දීමනාව, ආබාධිත සෙබළුන් සඳහා ආධාර, ගැබිණි මව්වරුන් සඳහා ලබා දෙන ලද ආහාර පැකේජය, පොහොර සහනාධාරය සහ පාසල් නිල ඇඳුම් සහ පෙළ පොත් ඇතුළු ගෘහස්ථ සහනාධාර සඳහා රජය විසින් රුපියල් බිලියන 264.39ක මුදලක් දරන ලදි.

සමෘද්ධි නිත්‍ය දීමනාවට අමතරව අතිරේක දීමනාවක් සහ පොරොත්තු ලේඛණ ගත ප්‍රතිලාභීන්ට ද දීමනාව ලබා දීම සඳහා රජය විසින් ගන්නා ලද තීරණය හේතුවෙන් 2023 වර්ෂයේ පළමු මාස හතර සඳහා අඩු ආදායම්ලාභී පවුල් වලට ලබා දුන් සමෘද්ධි මුදල් ප්‍රදානය සඳහා වූ වියදම 2022 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුළ පැවති රු. මිලියන 20,679 සිට රු. මිලියන 55,593 දක්වා වැඩි වී ඇත. 2023 වර්ෂය සඳහා සමෘද්ධි සහ අනෙකුත් වර්ගීකරණ ගෙවීම් සඳහා ඇස්තමේන්තුගත වියදම් රුපියල් බිලියන 200 ක් ලෙස ද ගණන් බලා ඇත.

රජයේ රෝහල්වලට වෛද්‍ය සැපයුම් ද ඇතුළුව සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සඳහා 2023 වසරේ මුල් මාස හතර තුළ රජයේ වියදම 2022 වසරේ එම කාලය සඳහා වූ රු. මිලියන 19,655ට සාපේක්ෂව රු. මිලියන 42,526ක් ලෙස සියයට 116.36ක ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇත. අදාළ කාලය සඳහා දුෂ්කර පාසල්වල සිසුන් සඳහා නොමිලේ පෙළපොත්, නිල ඇඳුම් සහ පාවහන් වැනි අධ්‍යාපනය පිළිබඳ සුබසාධන වැඩසටහන් සඳහා වැය වූ මුදල රු. මිලියන 8,771 කි.

රසායනික පොහොර සඳහා 2023 වසරේ පළමු මාස හතර තුල රජයේ සහනාධාරය රුපියල් මිලියන 13,772 ලෙස සටහන් කිරීමද වැදගත් වේ.

**2.10 වගුව : 2023 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා වියදම්**

රු. මිලියන

| වැඩසටහනේ නම | 2023 (තාවකාලික) |
|---|---|
| **සමාජ සුබසාධනය** | |
| සමෘද්ධි සහනාධාර | 55,593 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 1,800 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 6,750 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 941 |
| රණවිරු මාපිය රැකවරණ , දීමනාව | 754 |
| ගංවතුර හා නියං සහනාධාර | 8 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 54 |
| මියගිය හා තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දි | 13,015 |
| **සෞඛ්‍ය හා පෝෂණ** | |
| ත්‍රිපෝෂ වැඩසටහන | 152 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල | 285 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර වැඩසටහන | 1,400 |
| නැවුම් කිරි වැඩසටහන- පාසල් ළමුන් | - |
| පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය | 500 |
| පෙර පාසල් ළමුන් සඳහා උදය ආහාරය | 5 |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් සමග) | 42,526 |
| **අධ්‍යාපනය** | |
| පාසල් පෙළ පොත් | 7,071 |
| පාසල් නිල ඇඳුම් | 832 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල ළමුන් සඳහා පාවහන් | - |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 152 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 716 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ලැප්ටොප් පරිගණක හා වයිෆයි පහසුකම් සඳහා පොළී සහනාධාර | 0.13 |
| රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | - |
| දහම් පාසල් ශිෂ්‍යයින් සඳහා  පෙළ පොත් | 0.19 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | - |
| **සහනාධාර** | |
| පොහොර සහ බෝග සහනාධාර | 13,772 |
| **වෙනත් සහනාධාර** | |
| ආදායම් නොලබන මාර්ගවල බස්රථ ධාවනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබාදෙන සහනාධාර, පාසල් වාර ප්‍රවේශ පත්‍ර හා සන්නද්ධ හමුදා නිදහස් ගමන් වාර ප්‍රවේශපත්‍ර | 3,296 |
| **එකතුව** | **149,622** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### ආංශික වියදම

### පාසල් අධ්‍යාපනය

2023 වසරේ පළමු මාස හතර තුළ පාසල් අධ්‍යාපනය සඳහා රු. මිලියන 102,624ක මුදලක් වැය කර ඇති අතර, එයින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙළින් රු. මිලියන 101,211 ක් සහ රු. මිලියන 1,413 ක් විය. පාසල් පෙළ පොත් මුද්‍රණය සඳහා කඩදාසි මිල ඉහළ යාම හේතුවෙන්, පළමු මාස හතර තුළ 2022 වසරේ අදාළ කාලයට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 6කින් ඉහළ ගොස් ඇත.

රජය විසින් 2023 වසරේ පාසල් පෝෂණ ආහාර වැඩසටහන, පාසල් පෙළ පොත් මුද්‍රණය සහ දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාසල් නිල ඇඳුම්, පාවහන් ලබා දීම වැනි සුබසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2023 වසරේ පාසල් දරුවන්ගේ පෝෂණ

තත්ත්වයට බලපෑ ආහාරවල මිල ඉහළ යාම අවම කිරීම සඳහා රජය විසින් එක් සිසුවෙකුගේ පෝෂණීය ආහාර වේලක දිනක මිල රු. 30 සිට රු. 100 දක්වා වැඩි කිරීම මඟින් හා රු. මිලියන 1,400 ක් වැය කිරීමෙන් ඊට ප්‍රතිචාර දක්වන ලදී. පළමු මාස හතර තුළ පාසල් පෝෂණ ආහාර වැඩසටහන සහ පෙළ පොත් මුද්‍රණය සහ පාසල් නිල ඇඳුම් සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 9,969 කි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම සුබසාධන වැඩසටහන් සඳහා දරන ලද වියදම පසුගිය වසරේ අදාළ කාලයට සාපේක්ෂව සියයට 180 කින් පමණ ඉහළ ගොස් ඇත. මෙම ආර්ථික තත්ත්වය මධ්‍යයේ ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වශයෙන් පාසල්වල පුනරුත්ථාපන/ යටිතල පහසුකම් සංවර්ධනය, පළාත් අධ්‍යාපන අංශය ඇතුළු ගුණාත්මක සංවර්ධන ප්‍රතිසංස්කරණ සඳහා වැය කෙරිණි.

**2.11 වගුව : 2023 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි | 84,089 | 83,909 |
| ජාතික | 25,519 | 17,669 |
| පළාත් | 58,570 | 66,240 |
| සුභසාධන වැඩසටහන | 3,558 | 9,969 |
| විභාග ඇගයීම් කටයුතු | 299 | 649 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය | 386 | 377 |
| විශේෂ අධ්‍යාපන සංවර්ධනය | 59 | 2 |
| ගුරු සංවර්ධනය | 10 | 12 |
| පළාත් අධ්‍යාපනය | 582 | 981 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## උසස් අධ්‍යාපනය

2022 මුල් මාස 04ට සාපේක්ෂව 2023 මුල් මාස 04 තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන මුළු වියදම සියයට 14.3 කින් වැඩි වූ අතර එය රු.මිලියන 24,318 ක් විය. පුනරාවර්තන වියදම සියයට 4.8 කින් වැඩි වූ අතර එය රු.මිලියන 19,210 ක් විය. 2022 වර්ෂයේ මුල් මාස 04 සාපේක්ෂව 2023 වර්ෂයේ මුල් මාස 04 තුළ මූලධන වියදම සියයට 72.5 කින් වැඩි වූ අතර එය රු.මිලියන 5,108 ක් විය.

**2.12 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම් | 16,585 | 16,796 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 450 | 716 |
| **මූලධන වියදම** | | |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 970 | 967 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය - කුවේට් රජය) | 360 | - |
| විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය-ආ.සං.බැ.) | 905 | 1,286 |
| වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය-සවුදි රජය) | 386 | 342 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය

2023 වර්ෂයේ දී මුල් මාස 04 තුළ දී නිපුණතා සංවර්ධනය සහ වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් රු. මිලියන 2,365 ක් පුනරාවර්තන වියදම් වශයෙන් ද මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 201 ක් ද ලෙස රු. මිලියන 2,565 ක වියදමක් දරන ලදි.

**2.13 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා නිපුණතා සංවර්ධනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| නිපුණතා සිසුදිරිය ශිෂ්‍යාධාර වැඩසටහන | - | 194 |
| නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ආ.සං.බැ/ලෝ.බැ) | - | 152 |
| තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම | 35 | - |
| ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/කොයිකා) | - | 48 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## පර්යේෂණ හා නව නිපැයුම් සංවර්ධනය

2023 වර්ෂයේ දී මුල් මාස 04 තුළ දී පර්යේෂණ හා නව නිපැයුම් සංවර්ධනය වෙනුවෙන් රු. මිලියන 529 ක් පුනරාවර්තන වියදම් වශයෙන් ද මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 100 ක් ද ලෙස රු. මිලියන 630 ක වියදමක් දරන ලදි.

**2.14 වගුව : 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා පර්යේෂණ සහ නව නිපැයුම් ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වියදම්**

රු. මිලියන

| ව්‍යාපෘතිය/ වැඩසටහන | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකා ජීව තාක්ෂණ ආයතනය | – | 94 |
| විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන | 0.3 | 2 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## සෞඛ්‍යය

2023 වර්ෂයේ පළමු මාස හතර තුළ දී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම පළාත් සහ මධ්‍යම රජයේ සෞඛ්‍යය සඳහා වන වියදම ද ඇතුළත්ව 2022 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී රු.මිලියන 123,661 ක් දක්වා සියයට 29.1 කින් වැඩි වී ඇත. සෞඛ්‍යය සඳහා වන මුළු වියදමින් රු.මිලියන 117,215 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර මූලධන ආයෝජනය රු.මිලියන 6,446 කි. පුනරාවර්තන වියදම්වල ප්‍රධාන කාණ්ඩවලින් එකක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ කරන ලද මුළු වියදම වන රු. මිලියන 41,146 ක් වියදම් කර ඇත්තේ ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර අයිතම සඳහාය.

**2.15 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | **87,447** | **117,215** |
| සේවා සැපයීමේ වියදම | 47,786 | 47,483 |
| වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 37,233 | 38,620 |
| වෛද්‍ය සැපයීම් | 19,637 | 41,146 |
| පළාත් සෞඛ්‍ය | 20,024 | 28,586 |
| **රාජ්‍ය ආයෝජන වියදම** | **8,281** | **6,446** |
| වෛද්‍ය උපකරණ | 172 | 560 |
| සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ආ.සං.බැ) | 286 | 155 |
| කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 3,323 | 174 |
| තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම (එක්සිම් බැංකුව, චීන රජය ) | 449 | - |
| සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල හදිසි අනතුරු ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම | 58 | 137 |
| බාහිර රෝගී සේවා සංකීර්ණය සංවර්ධනය - කොළඹ ජාතික රෝහල (ශ්‍රී ලංකා රජය - චීන රජය) | 2 | - |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබා දීම | - | 53 |
| හෙද පීඨය/ නේවාසිකාගාරය ඉදිකිරීම | 50 | 23 |
| වෙනත් මූලධන ආයෝජන | 2,924 | 5,345 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 1,017 | 2,100 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## වාරිමාර්ග හා ජල කළමනාකරණය

2023 පළමු මාස හතර තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වූ මුළු ආයෝජනය රු. මිලියන 10,248ක් වූ අතර එය සියයට 9.82 ක අඩු වීමකි. 2022 වසරේ එම කාල සීමාව තුළ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ඇතුළු වාරිමාර්ග පද්ධති සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 11,364 ක් වැය කර ඇත. මෙම වසරේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා රු. මිලියන 3,477 ක් වැය කර ඇති අතර ඉතිරි රු. මිලියන 6,771 ක මුදල වාරිමාර්ග පද්ධති සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලදී.

## කෘෂිකර්මය

පශු සම්පත්, වැව්ලි, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන්ද ඇතුලත්ව කෘෂිකර්ම අංශය සඳහා 2023 වසරේ පළමු මාස හතර තුල රු.මිලියන 20,785ක වියදමක් දරා ඇත. එය 2022 එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.8ක පමණ වැඩි වීමකි. මෙම මුදලින් රු.මිලියන 13,513ක් රසායනික හා කාබනික පොහොර සඳහා පොහොර සහනාධාර වැඩසටහන වෙනුවෙන් වියදම් කර ඇත. තවද කෘෂි භෝග සඳහා රු.මිලියන 786ක් සහ වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු.මිලියන 17ක් ද, ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු.මිලියන 290 ක් ද, ඉඩම් සංවර්ධනය සඳහා රු.මිලියන 79 ක් ද, වියදම් දරා ඇති අතර ඉතිරිය පශු සම්පත් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ප්‍රතිලාභීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් වැය කර ඇත.

## ජල සම්පාදන හා සනීපාරක්ෂාව

2023 වසරේ පළමු මාස හතර තුළ රු.මි. 17,294 ක පිරිවැයකින් යුතු දේශීය සහ විදේශීය බැංකුවලින් ලබා ගත් ණය සේවාකරණය ඇතුළුව, සුරක්ෂිත පානීය ජලය හා ගුණාත්මක සනීපාරක්ෂා සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සඳහා රජය විසින් අඛණ්ඩව වියදම් දරණ ලද අතර, එය 2022 වර්ෂයේ එම කාල පරිච්ඡේදයට සාපේක්ෂව ආසන්න වශයෙන් සියයට 100 ක පමණ වර්ධනයකි. ව්‍යාපෘති 248 කින් සමන්විත " ධාරිතා වැඩි දියුණු කිරීමේ සහ බෙදා හැරීම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය " (මීන් පෙර "සැමට ජලය" යන උපව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ), නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන

යෝජනා ක්‍රම ස්ථාපනය කිරීම සහ සමස්ත ජනගහනයට සුරක්ෂිත පානීය ජලය වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීමේ අරමුණින් 2023 වසරේදී ක්‍රියාත්මක කරනු ලබයි.

**2.16 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා තෝරාගත් ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති වියදම්**

රු. මිලියන

| ව්‍යාපෘතිය | 2023 (තාවකාලික) |
|---|---|
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව) | 5,052 |
| ජල සම්පාදන සහ සනීපාරක්ෂක වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 3,434 |
| මාතලේ මහනගර ජල සම්පාදන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය /ප්‍රංශ රජය) | 1,902 |
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 2 (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව) | 1,817 |
| අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / ප්‍රංශය) | 1,758 |
| ධාරිතාව වැඩි දියුණු කිරීම සහ බෙදා හැරීමේ ව්‍යාපෘතිය | 1,702 |
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3 (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව) | 951 |
| රුවන්වැල්ල මහනගර ජල සම්පාදන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / කොරියාව) | 487 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### මහාමාර්ග හා පාලම්

2023 වර්ෂයේ පළමු මාස හතර තුළ මාර්ග හා පාලම් සඳහා වියදම රු.මිලියන 81,626 ක් වූ අතර එය 2022 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට සියයකටත් වඩා වැඩි වීමකි. මෙම වසරේ පළමු කාර්තුව තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ අතැති බිල්පත් සඳහා ගෙවීම් කිරීමට රජය ප්‍රමුඛතාව ලබා දී ඇත. මුළු වියදමින් රු. මිලියන 18,925 ක් ජාතික හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා වැය කර ඇත. මේ යටතේ රු.මිලියන 4,034 ක මුදලක් ඒකාබද්ධ මාර්ග සංවර්ධන සඳහා වැය කර ඇති අතර එමගින් කි.මී.6,000 කට අධික ග්‍රාමීය හා පළාත්බද මාර්ග පිළිසකර කිරීම හා වැඩිදියුණු කිරීම ඉලක්ක කොට ගෙන ඇත. තව ද, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සම්බන්ධිතතාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශ වීම සඳහා කි.මී. 100,000 ක විකල්ප මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික වශයෙන් අතැති බිල්පත් ගෙවීම සඳහා රු.මිලියන 8,269 ක වියදමක් දරා ඇත.

අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා වියදම රු.මිලියන 17,666 ක් වූ අතර එයින් සැලකිය යුතු ප්‍රමාණයක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත. මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වියදම රු.මිලියන 511 ක් වූ අතර පාලම් සංවර්ධනය හා ගුවන් පාලම් ඉදිකිරීම සඳහා වැය වූ මුදල රු.මිලියන 941 කි.

එමෙන්ම, මාර්ග පිළිසකර කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකු වලින් ලබාගත් ණය සහ අදාළ පොළී වශයෙන් රු.මිලියන 39,960 ක් ගෙවා ඇති අතර සමස්ත වියදමෙන් විශාල ප්‍රමාණයක් මේ සඳහා දරා ඇත.

### ප්‍රවාහන

2023 වර්ෂයේ පළමු මාස හතරක කාල සීමාව සඳහා ප්‍රවාහන අංශය වෙනුවෙන් රජය කරන ලද මුළු වියදම රු. මිලියන 19,289 ක් වන අතර එය 2022 වර්ෂයේ අදාළ කාලයට සාපේක්ෂව සියයට 7ක වැඩිවීමකි. එයින් රු. මිලියන 14,218 ක් හා රු. මිලියන 5,071 ක් පිළිවෙලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කටයුතු කිරීම සහ දුම්රිය ඇණියේ සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාව යන ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 1,340 ක වියදමක් දුම්රිය දෙපාර්තමේන්තුව මගින් දරන ලදි.

ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ හමුදා නිදහස් ගමන් වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම යන සුභ සාධක සේවාවන් වෙනුවෙන් 2023 පළමු මාස හතරෙහි රජය විසින් රු. මිලියන 3,118 ක් වියදම් දරා ඇත. අදාල කාලයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 776 ක වියදමක් දරන ලදි.

### නිවාස සංවර්ධනය

2023 වසරේ පළමු මාස හතර තුළ නිවාස හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා රු. මිලියන 344 ක් වැය කර ඇත. එය 2023 වසරේ අදාළ කාලය තුළ වාර්තා වූ රු. මිලියන 1,351 ට සාපේක්ෂව සියයට 75 ක පසුබෑමකි. ග්‍රාමීය, නාගරික, වතු, විරු සුමිතුරු සහ වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ජනතාව ඇතුළු අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 329 ක් වැය කර ඇත.

### නාගරික සංවර්ධනය

2023 වසරේ පළමු මාස හතර තුළ නාගරික සංවර්ධනය හා වන මුළු වියදම රු. මිලියන 8,211 ක් විය. එය 2022 වසරේ අදාළ කාල සීමාව තුළ වාර්තා වූ රුපියල් මිලියන 5,408 ට සාපේක්ෂව සියයට 52 ක වර්ධනයකි. එයින් රු. මිලියන 820 ක් පුනරාවර්තන වියදම් වූ අතර රු. මිලියන 7,391 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වැය කරන ලදි.

2.17 වගුව : 2023 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මහාමාර්ග හා පාලම් සඳහා වන වියදම

රු. මිලියන

| | ව්‍යාපෘතිය/ වැඩසටහන | 2022 | 2023 (තාවකාලික) |
|---|---|---|---|
| **1** | **අධිවේගී මාර්ග සංවර්ධනය** | **1,430** | **17,666** |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 238 | 13,933 |
| | කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 117 | 10 |
| | කණු මත දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය | 54 | 13 |
| | කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය | 1,021 | 1,965 |
| | දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | – | 1,745 |
| **2** | **මහාමාර්ග සංවර්ධනය** | **16,123** | **17,845** |
| | මාර්ග නඩත්තුව | 688 | 1,434 |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 158 | 276 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 438 | 316 |
| | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 10,613 | 4,034 |
| | මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | 1,200 | 15 |
| | අන්තර්ගතිකව සහසම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය | 21 | 1,740 |
| | ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ගවලට ප්‍රවේශ වීමට සහ වාහන තදබදය අවම කිරීමට විකල්ප මාර්ග ජාලයක් සංවර්ධනය කිරීම | 2,436 | 8,269 |
| | අනෙකුත් මාර්ග සංවර්ධනය | 569 | 1,761 |
| **3** | **මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම** | **113** | **511** |
| **4** | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | **606** | **941** |
| | ජාතික මාර්ග ජාලයේ හානි වූ  සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය | 32 | 130 |
| | පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 303 | 125 |
| | දෙවන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 21 | 2 |
| | කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 226 | 115 |
| | උත්තරානන්ද මාවතේ සහ කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම | 2 | 559 |
| | අනෙකුත් (ගුවන් පාලම් ද ඇතුළුව) | 22 | 10 |
| **5** | **ස්වාභාවික ව්‍යවසනවලින් බලපෑමට ලක්වූ මාර්ග පුනරුත්ථාපනය** | **12** | **–** |
| **6** | **මඟනැගුම, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන** | **1,134** | **1,080** |
| **7** | **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාරු කිරීම්** | **2,550** | **3,000** |
| **8** | **ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති)** | **50** | **623** |
| **9** | **මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය හිගය පියවීම සඳහා ලබාදුන් මූල්‍ය දායකත්වය** | **14,380** | **39,960** |
| **10** | **අනෙකුත්** | **–** | **–** |
| | **එකතුව** | **36,398** | **81,626** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

නාගරික සංවර්ධන අංශයේ සමස්ථ වියදමෙන් කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය, උපායමාර්ගික නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවරල ගාල්ල සහ යාපනය), වේරැස් ගඟ ව්‍යාපෘතිය, සියක් නගර වැඩසටහන සහ පළාත් නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු මිලියන 5,011 ක මුදලක් වැය කර ඇත.

## භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2023 වර්ෂයේ මුල් මාස හතර තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රුපියල් බිලියන 782.0 ක් වු අතර එය රුපියල් බිලියන 830.3 ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 94.2 කි. මේ අතර 2023 වර්ෂයේ මුල් මාස හතර තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රුපියල් බිලියන 1,619.7 ක් වු අතර එය රුපියල් බිලියන 1,732.8 ක් වු ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 93.5 කි. මෙය 2022 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදයේ රුපියල් බිලියන 1,249.3 සමඟ සැසඳීමේදී සියයට 29.6 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2023 අප්‍රේල් 30 දිනට මුළු මුදල් හිඟය රුපියල් බිලියන 837.7 ක් වු අතර 2022 වර්ෂයේ අප්‍රේල් 30 දිනට

පැවති රුපියල් බිලියන 650.8ට සාපේක්ෂව එය සියයට 28.7 වැඩිවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ මෙහෙයුම් වියදම් සියයට 39.4 කින් වැඩිවීමයි. 2023 වර්ෂයේ අප්‍රේල් 30 දිනට සමස්ත මුදල් හා බැංකු ශේෂ හිඟය රුපියල් බිලියන 4.9 ක් දක්වා අඩු වූ අතර, එය 2022 වර්ෂයේ අප්‍රේල් 30 දිනට රුපියල් බිලියන 230.3 ක් විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආදායම සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබීම් සියයට 30.7 කින් වැඩිවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුද මගින් විස්තීර්ණ අරමුදල්

**වගුව 2.18 : රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්ව ප්‍රකාශය : 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. බිලියන

| | 2022 | 2023 | |
|---|---|---|---|
| | තත්‍ය | ඇස්තමේන්තුගත | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -831.6 | -84.2 | -84.2 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 598.5 | 830.3 | 782.0 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -998.8 | -1,535.0 | -1,392.9 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -250.5 | -197.8 | -226.8 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -650.8 | -902.5 | -837.7 |
| දළ ණය ගැනීම් භාවිතය * | 1,754.1 | 1,497.1 | 1,384.6 |
| ණය ආපසු ගෙවීම් | -605.6 | -549.1 | -474.8 |
| ශුද්ධ ණය ගැනීම් භාවිතය | 1,148.5 | 948.0 | 909.8 |
| පෙර වසරේ වාණිජ ණය ගැණීම් ශේෂය | 4.5 | - | - |
| ගැලපීම් ගිණුමේ ශේෂය : TEB / ශුද්ධ තැන්පතු යනාදිය) | 99.1 | - | 7.2 |
| අවසාන මුදල් ශේෂය | **-230.3** | **-38.7** | **-4.9** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## රාජ්‍ය ණය කළමණාකරනය


2023 වර්ෂයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු ණය ගැනීම් සීමාව රුපියල් බිලියන 4,979 වන අතර, 2023 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට අප්‍රේල් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය භාවිතය රුපියල් බිලියන 1,384.6 කි. මෙම කාලය තුළදී මුදල් ප්‍රවාහ මෙහෙයුම් හා සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා දේශීය හා විදේශීය වශයෙන් පිළිවෙලින් රුපියල් බිලියන 1,196.0 ක සහ රුපියල් බිලියන 188.6 ක මුළු ණය ලබාගෙන ඇත. 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ සියයට 86.4 ක්ම දේශීය ණය ගැනීම් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුව 2023 මුල් මාස හතර තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 49 ක් පමණ භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගෙන ඇති අතර සියයට 42 ක් භාණ්ඩාගාර බැඳුම්කර නියෝජනය කරන අතර තවත් සියයට 9 ක් ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් මගින් ලබාගෙන ඇත. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව අවසන් වන විට ශුද්ධ ණය ගැනීම රුපියල් බිලියන 909.8 කි.

**වගුව 2.19 : දේශීය දළ ණය ගැනීම් 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

| අයිතමය | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 502.9 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 598.4 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 109.0 |
| විදේශ මුදල් බැංකු ඒකක ණය | -14.3 |
| **එකතුව** | **1,196.0** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**රූප සටහන 2.3 : දේශීය දළ ණය ගැනීම් (2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා)**




මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙළිදරව් කිරීම

2023 අප්‍රේල් 30 වන දිනට නිකුත්කල හා එදිනට පවතින භාණ්ඩාගාර ඇපකර වල වටිනාකම රුපියල් බිලියන 1,550.4 ක් වන අතර එය 2016 අංක 13 දරණ රාජ්‍ය මූල්‍ය කළමණාකරන (වගකීම්) (සංශෝධන) පනතේ දෙවන වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇත. 2023 අප්‍රේල් 30 වන දිනට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව වගු අංක 2.20 හි දක්වා ඇත.

වගුව 2.20 : 2023.04.30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 15,633.33 | 128,520.26 |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2,539.60 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 23,640.67 | |
| | | ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | 500.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7,336.78 | |
| | | ජාතික කඩදාසි සංස්ථාව | 140.00 | |
| | | වී අලෙවි මණ්ඩලය | 760.75 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 58,078.53 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,350.00 | |
| | | ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමටඩ් | 15,449.60 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100.00 | |
| | | ලංකා සතොස ලිමිටඩ් | 2,241.00 | |
| | | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | |
| 2 | ලංකා බැංකුව | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | 404,028.74 |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 4,780.00 | |
| | | ශ්‍රී ලංකා ධීවර සංස්ථාව | 250.00 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 100,000.00 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 835.00 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 200.00 | |
| | | ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | 49,500.00 | |
| | | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය | 8,600.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 68,489.67 | |
| | | නෝර්ත් සී ලිමිටඩ් | 38.63 | |
| | | වී අලෙවි මණ්ඩලය | 500.00 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 147,102.33 | |
| | | ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ් | 11,506.30 | |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 1,126.81 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 200.00 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | |
| | | ලිට්රෝ ගෑස් සමාගම | 8,000.00 | |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 7,500.00 | 203,019.18 |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 41,372.91 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 32,710.61 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 114,415.66 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව | 3,500.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | |

| | | | | |
|---|---|---|---|---|
| | | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | |
| 4 | කොමර්ෂල් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 968.36 | 5,724.29 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,755.93 | |
| 5 | ඩී.එෆ්.සී.සී. බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | 11,922.75 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,896.51 | |
| 6 | චීන එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 29,145.46 | 29,145.46 |
| 7 | හැටන් නැෂනල් බැංකුව | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 4,000.00 | 44,211.43 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,033.27 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 20,133.15 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 4,045.01 | |
| 8 | හොංකොන් ඇන්ඩ් ෂැංග 'හයි බැංකුව | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 14,510.41 | 14,510.41 |
| 9 | චීනයේ කර්මාන්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 13,798.49 | 13,798.49 |
| 10 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 183,076.14 | 183,076.14 |
| 11 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 21,380.43 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 6,299.21 | 27,679.63 |
| 12 | ඉන්දියා එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 84,390.48 | 84,390.48 |
| 13 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 54,247.46 | 54,247.46 |
| 14 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 131,500.56 | 147,938.13 |
| | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 16,437.57 | |
| 15 | සම්පත් බැංකුව පී. එල්. සී. | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 |
| 16 | යුනික්‍රෙඩිට් බැංක් ඔස්ට්‍රියා AG | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 18,401.02 | 18,401.02 |
| 17 | අයි.එන්.ජී. බැන්ක්, එන් වී ඔෆ් නෙදර්ලන්ඩ්ස් | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 30,166.01 | 30,166.01 |
| 18 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,945.02 | 3,945.02 |
| 19 | චයිනා නැෂනල් කෙමිකල් ඉන්ජිනියරින් නො. 14 කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ් | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 14,391.09 | 14,391.09 |
| 20 | ඩී. බී. ට්‍රස්ට්‍රීස් හොංකොං ලිමිටඩ් | ශ්‍රී ලංකා ගුවන් සමාගම | 57,531.50 | 57,531.50 |
| 21 | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | නෝර්ත් සී ලිමිටඩ් | 60.00 | 60.00 |
| 22 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | ලංකා බැංකුව හා මහජන බැංකුව | 59,175.25 | 59,175.25 |
| එකතුව | | | **1,550,382.74** | **1,550,382.74** |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

# 3 වන පරිච්ඡේදය

# රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

## සමාලෝචනය

දේශීය ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමත්, මුදල් ඒකකයේ සාපේක්ෂ ස්ථාවරත්වයත් හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු වී ඇති බව, ප්‍රධාන රාජ්‍ය ව්‍යාවසායයන් 52 විසින් 2022 වසරේ පළමු මාස හතරේ වාර්තා කළ රු. බිලියන 859 ක අලාභයට සාපේක්ෂව 2023 වසරේ සමාන කාල සීමාව තුළ රු. බිලියන 144 ක ලාභයක් වාර්තා කිරීම මගින් ගම්‍ය වේ. 2022 සහ 2023 වර්ෂවලදී සිදු කල පිරිවැය මත පදනම් වු විදුලි ගාස්තු ගැලපීම, ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ සඳහා මුලපිරීම මෙම කාර්යසාධනය ඉහළ යාමට ඉවහල් වී ඇත. 2022 මුල් භාගයේදී සැලකිය යුතු ලෙස මුදල් අවප්‍රමාණය වීම පසුගිය වසරේ ඩොලර් ණය පැවති රාජ්‍ය ව්‍යවසායන්හි පාඩු සඳහා හේතු විය. ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම මෙන්ම 2023 මුල් මාස හතර තුළ වඩාත් ස්ථාවර විනිමය තත්ත්වයක් පැවතීම නිසා 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාඩු අවම වී ඇත. ඛනිජ තෙල් කර්මාන්තයේ සිල්ලර වෙළඳාම සම්බන්ධයෙන් තරඟකාරීත්වයක් හඳුන්වා දීමෙන් එම කර්මාන්තය ලිහිල් කර ඇති අතර, ඉන්ධන සහ විදුලිය යන අංශ දෙක සඳහාම හඳුන්වා දී ඇති ස්වයංක්‍රීය පිරිවැය පරාවර්තක මිලකරණ ක්‍රමවේදය හේතුවෙන් බැංකු පද්ධතියට එල්ල වන අහිතකර පීඩනය සීමා වනු ඇත.

දේශීය ආර්ථිකය තවදුරටත් ස්ථාවර කිරීමටත්, අනාගත වර්ධන විභවයන් සක්‍රීය කිරීමටත් රාජ්‍ය ව්‍යාවසායයන්හි පුළුල් ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය ව්‍යාවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණෙන් රාජ්‍ය ව්‍යාවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය පිහිටුවීම ඇතුළු ප්‍රධාන පියවර ගැනීම හරහා, ප්‍රධාන රාජ්‍ය ව්‍යාවසායයන්හි පාලනය, තරඟකාරීත්වය හා මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම යන ප්‍රධාන රාජ්‍ය ව්‍යාවසායයන් හතරක ශේෂ පත්‍ර වැඩිදියුණු කිරීම, ප්‍රධාන රාජ්‍ය ව්‍යාවසායයන් 52 හි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම සහ තෝරාගත් රාජ්‍ය ව්‍යාවසායයන් සමග පැහැදිලිව හඳුනාගත් ඉලක්කයන් ඇතුළත් සාමූහික අභිලාශ ප්‍රකාශ ගිවිසුම්වලට එළඹීම මගින්', රාජ්‍ය මූල්‍ය මත ඇතිවිය හැකි අවදානම් අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ.

2022 වසරේ මුල් මාස හතර තුළ එකතු කළ රු. බිලියන 11.4 ක අයභාර හා ලාභාංශ ආදායමට සාපේක්ෂව 2023 වසරේ එම කාලසීමාව තුළ රාජ්‍ය ව්‍යාවසායයන් වෙතින් ඒකාබද්ධ අරමුදලට ලද අයභාර හා ලාභාංශ ආදායම රු. බිලියන 9.6 ක් දක්වා පහත වැටී ඇත.

## රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2022 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 4,336 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2023 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 4,023 ක් දක්වා සියයට 7.2 කින් පහළ ගොස් ඇත. 2022 අවසානය වන විට රු. බිලියන 3,335 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු ප්‍රමාණය 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 3,377 ක් දක්වා සියයට 1.2 න් ඉහල ගොස් ඇත. 2022 අවසන් වන විට සියයට 5.27 ක් වූ අදියර III ණය අනුපාතය, 2023 අප්‍රේල් මස අවසානය වන විට සියයට 6.8 ක් දක්වා මද වශයෙන් පිරිහී ඇත. 2022 මූල්‍ය වර්ෂයේ මුල් මාස හතර සඳහා වාර්තා කරන ලද රු. බිලියන 19.9 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා ලංකා බැංකුව රු. බිලියන 3.4 ක බදු පෙර ලාභයක් වාර්තාකර ඇත.

### මහජන බැංකුව

2022 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 2,972 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2023 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 2,914 ක් දක්වා සියයට 1.9 කින් පහළ ගොස් ඇත. 2022 අවසානය වන විට රු. බිලියන 2,372 ක් වූ තැන්පතු ප්‍රමාණය 2023 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,428 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. එසේම, 2022 වර්ෂය අවසානය වන විට පැවැති රු. බිලියන 1,783 ක් වූ ණය සහ අත්තිකාරම් 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 1,830 ක් දක්වා සියයට 2.6 කින් ඉහළ ගොස් ඇත. 2022 වර්ෂය අවසානය වන විට සියයට 12.8 ක් වූ අදියර III ණය අනුපාතය 2023 අප්‍රේල් මස අවසානය වන විට සියයට 18.3 ක් දක්වා පිරිහී ඇත. 2022 සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 9.6 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2023 අප්‍රේල් මාසය දක්වා මුල් මාස හතර තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 6.3 ක් ලෙස වාර්තා වී ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2022 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,617 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම, 2023 මාර්තු මස අවසන් වන විට රු. බිලියන 1,640 ක් දක්වා සියයට 1.4 කින් වර්ධනය වී ඇත. 2022 අවසානය වන විට රු. බිලියන 1,477 ක් වූ තැන්පතු පදනම 2023 මාර්තු මස අවසානය වන විට රු. බිලියන 1,496 ක් දක්වා සියයට 1.2 කින් වර්ධනය වී ඇත. එසේම, 2022 වර්ෂය අවසානය වන විට පැවැති රු. බිලියන 553 ක් වූ ණය සහ අත්තිකාරම් වටිනාකම 2023 වසරේ පළමු මාස තුන තුළ රු. බිලියන 544 ක් දක්වා සියයට 1.6 කින් පහළ ගොස් ඇත. 2022 සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 8.6 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2023 වසරේ පළමු මාස තුන තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 2.0 ක් ලෙස වාර්තා කර ඇත.

### සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2023 වර්ෂයේ පළමු මාස හතර තුළ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බදු පෙර ලාභය රු. මිලියන 4,458 ක් වූ අතර එය 2022 වසරේ සමාන කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 51 ක අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සමාගමේ විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙණුවල උපලබ්ධි නොවූ අලාභයන් වේ. මෑතකදී, ෆිච් රේටින් සේවාව මගින් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය A සිට AA දක්වා පහත හෙලනු ලැබුවේ මෑත කාලීන ස්වෛරීත්වය පහත හෙලීම සහ එම ආයතනයේ ශ්‍රී ලංකා ජාතික ශ්‍රේණිගත කිරීමේ පරිමාණය නැවත ක්‍රමාංකනය කිරීමෙන් පසුවය. රජය සතු ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ප්‍රමුඛතා පදනම මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතිසංස්කරණය කිරීමට රජය විසින් හඳුනාගෙන ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම)

2023 වසරේ මුල් මාස හතර තුළ විදුලිබලය සඳහා වූ ඉල්ලුම 2022 වසරේ මුල් මාස හතර හා සැසඳීමේදී ගිගාවොට් පැය 4,935 සිට ගිගාවොට් පැය 4,516 දක්වා සියයට 22 කින් අඩු වී ඇත. එසේ වුවද, 2023 පෙබරවාරි 15 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි පිරිවැය පිළිබිඹු වන ලෙස සියයට 66 ක සාමාන්‍ය වැඩිවීමක් සමගින් සිදුකළ දෙවන මිල සංශෝධනය හේතුවෙන් අදාළ කාලසීමාව සඳහා විදුලිය අලෙවියෙන් උපයාගත් ආදායම දෙගුණයකටත් වඩා වැඩි විය. ඒ අනුව, 2023 වසරේ පළමු මාස හතර තුළ විදුලිය අලෙවියෙන් උපයා ඇති ආදායම රු. මිලියන 180,117 ක් ලෙස සටහන් විය. ඉදිරියේදී, ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මූල්‍යමය තිරසාරභාවයක් ඇති කිරීමට සහ රජයට ඇති වැය බර අවම කිරීම සඳහා ඉදිරි ප්‍රක්ෂේපිත පිරිවැය ප්‍රතිසාධන පදනමක් මත පදනම් වූ විධිමත්, අර්ධ-වාර්ෂික අවසාන පාරිභෝගික ගාස්තු සංශෝධනයක් ලංවිම විසින් ක්‍රියාත්මක කරනු ඇත. කෙසේ වෙතත්, ජාත්‍යන්තර වෙළඳපොළේ ඉන්ධන සහ ගල් අඟුරු සඳහා රුපියල් මගින් ගණනය කරන මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, සෘජු උත්පාදන පිරිවැය 2022 වසරේ මුල් මාස හතර සඳහා පැවති රු. මිලියන 114,460 ට සාපේක්ෂව සියයට 55 කින් රු. මිලියන 177,468 ක් දක්වා වැඩි විය. තවද, බැංකු ණය පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ මූල්‍ය පිරිවැය 2022 වසරේ පළමු මාස හතරේ වූ රු. මිලියන 5,876 සිට රු. මිලියන 23,264 දක්වා ඉහළ ගොස් ඇත. විදුලි බිල වැඩි කළද, ප්‍රමාද වූ ගාස්තු වැඩිවීම සහ උත්පාදන පිරිවැයේ සැලකිය යුතු වැඩි වීම සම්පූර්ණයෙන් ආවරණය කිරීමට අපොහොසත්වීම හේතුවෙන් 2023 මුල් මාස හතර තුළ රු. මිලියන 29,797 ක මෙහෙයුම් අලාභයක් ලංවිම ලබා ඇත.

තවද, 2022 වර්ෂයේදී කිලෝවොට් පැය එකකට රු. 26.95 ක් ලෙස පැවති විකුණුම් ස්ථානයේ ඒකකයක් සඳහා වන පිරිවැය 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ කිලෝවොට් පැය එකකට රු. 47.44 ක් ලෙස සැලකිය යුතු වැඩිවීමක් සිදු වී ඇත. 2022 වර්ෂයේ මුල් මාස හතර තුළ ජලː තාප (ඉන්ධන)ː තාප (ගල් අඟුරු)ː සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සහ සුළං 21:27:39:12 ලෙස පැවති උත්පාදන සංයුතිය 2023 පළමු මාස හතර තුළ 24:22:41:12 ලෙස වෙනස් වී ඇත.

2023 අප්‍රේල් මස අවසන් වන විට ලංවිම විසින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ගෙවිය යුතු ණය රු. බිලියන 216.92 දක්වා වැඩි වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින්, ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය බලශක්ති අංශයේ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් විසින් නිෂ්පාදනය කරන ලද විදුලිය සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් ඔවුන් දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇත. කෙසේ වෙතත්, රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත, නොරොච්චෝලේ බලාගාරය ඉදිකිරීම සඳහා (ඇ.ඩො. මිලියන 591.4) ලබා ගත් ණයෙහි 2022 දෙසැම්බර් අවසානය වන විට හිඟ ණය ශේෂය රු. බිලියන 214.7 රජයේ ශේෂපත්‍රයට මාරු කරන ලද අතර, 2022 දෙසැම්බර් අවසාන වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල උප ණය ලෙස සටහන් කර තිබූ රු. බිලියන 146.5 ක් රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලයෙහි ආයෝජනය කරන ලද ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්තනය කරන ලදී. එමඟින් 2022 අප්‍රේල් මාසය වනවිට රු. බිලියන 397.9 ක් ලෙස වාර්තා වූ නොගෙවූ ණය ප්‍රමාණය 2023 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 239.8 දක්වා අඩුවී ඇත.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2022 දෙසැම්බර් මාසයේ බැරලයකට ඇ.ඩො. 81 ක් වූ ගෝලීය වෙළඳපොලේ බොරතෙල් වල සාමාන්‍ය ආනයන මිල 2023 මාර්තු මාසයේදී ඇ.ඩො. 78.5 දක්වා තවත් පහත වැටුණි. කෙසේ වෙතත්, පෙර වසර හා සසඳන විට සියයට 16.8 ක පහත වැටීමක් සමඟ ඇ.ඩො. මිලියන 1,599.7 කට ආසන්න මුළු ඛනිජ තෙල් ආනයන වටිනාකම, 2023 පළමු මාස හතර තුළ රට

තුළට සිදු කරන ලද සමස්ත ආනයනවලින් සියයට 30 ක් පමණ නියෝජනය වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2023 පළමු මාස හතර සඳහා ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය ඇ.ඩො. මිලියන 877.35 ක් වූ අතර එය මුළු ඛනිජ තෙල් බිලෙන් සියයට 54 කට ආසන්න අගයක් නියෝජනය කරයි.

ජාත්‍යන්තර තෙල් මිල පහත වැටීමට සමගාමීව ආනයන වියදම අඩුවීම හේතුවෙන් 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන කාලසීමාව තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය ක්‍රමාණුකූලව වැඩිදියුණු වී ඇත. එය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2023 පළමු මාස හතර සඳහා රු. බිලියන 43.4 ක කැපී පෙනෙන ලාභයක් වාර්තා කිරීමට ඉවහල් විය.

තවද, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ දුර්වල මූල්‍ය තත්ත්වය සහ ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම ඇතුළුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වෙත ලැබිය යුතු මුදල් ප්‍රමාණය රු. බිලියන 238.9 කි. අනෙක් අතට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2023 අප්‍රේල් මස අවසානය වන විට ඉන්දියානු ණය පහසුකම යටතේ රජයට ගෙවීමට ඉතිරිව ඇති ණය (ඇ.ඩො. මිලියන 697 ), ජාතික ඉරාන තෙල් සමාගමේ ණය (ඇ.ඩො. මිලියන 251) සහ ලංකා බැංකුව ණය (රු. බිලියන 26.2) ගෙවීමට ඇත. එබැවින්, ඉන්ධන ආනයනය පහසු කිරීම සඳහා භාවිතා කරන ලද ඇ.ඩො. මිලියන 697 ක් වටිනා ඉන්දියානු ණය පහසුකම පියවීමේ අර්බුදයකට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පත් ව ඇත. එහෙයින්, මෙම මධ්‍යම රජය, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවතින අන්තර් වගකීම්, ප්‍රධාන රජය සතු ව්‍යාවසායන්වල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ රජයේ සමස්ත උපාය මාර්ගය තුළින් නිරාකරණය කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කලින් තීරණය කළ බෙදාහැරීම් නියෝජිතයන් හරහා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත සමාගම් දෙකක් සමඟ රජය ගිවිසුම් අත්සන් කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සිල්ලර වෙළඳාමේ තරඟකාරීත්වය වැඩි වන අතර පාරිභෝගිකයින්ගේ ප්‍රතිලාභ සඳහා සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කරනු ඇත.

### සීමාසහිත ශ්‍රීලන්කන් ගුවන් සමාගම

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ පවතින ඉහළ මූල්‍ය අවදානම් හේතුවෙන් මව් සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල අයිතිය බැහැර කිරීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ රජය සතු කොටස් අයිතිය බැහැර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර විකුණුම්-පාර්ශවික ගනුදෙනු උපදේශකයින් (එනම් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව) පත් කර ඇත. උපදේශක විසින් 2023 දෙසැම්බර් අවසානය වන විට නිසි ඇගයීමක් කිරීම හා බැහැර කිරීමේ උපායමාර්ගයන්ට අනුකූලව මෙකී ගනුදෙනුවේ (අදියර I) සම්පූර්ණ කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම සඳහා වන අදියර II සඳහා තවත් මාස 6 ක් ගතවනු ඇත.

අභියෝගාත්මක බාහිර හා අභ්‍යන්තර අරමුදල් සීමාවන් තිබියදීත්, 2022/23 මූල්‍ය වර්ෂයේ අවසන් කාර්තුව තුළ ශ්‍රීලන්කන් ගුවන් සමාගම රු. බිලියන 60.2 ක ලාභයක් වාර්තා කර ඇති අතර, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ඍණ ශුද්ධ වත්කම් ප්‍රමාණය 2023 වසරේ මාර්තු අවසානය වන විට රු. බිලියන 511 කි.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2022 වසරේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 54.9 ක් සහ සියයට 95 ක් වූ අතර, එයට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස තුනක කාලය තුළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 60.7 සහ සියයට 96.4 දක්වා ඉහළ නැංවීමට මණ්ඩලය සමත් වී ඇත.

2023 වසරේ පළමු මාස හතර තුළදී, සමස්තයක් වශයෙන් සම්බන්ධතා මිලියන 2.94 කට ළඟාවෙමින් සමඟින් නව ජල සම්බන්ධතා 120,000 ක් පද්ධතියට එක් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් විය. 2022 සැප්තැම්බර් මාසයේ සිට ජලය සඳහා නව ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත් සමඟ 2023 වසරේ පළමු මාස හතර සඳහා මණ්ඩලයේ ආදායම රු. මිලියන 16,597 ක් දක්වා වර්ධනය වූ අතර එය 2022 වසරේ අනුගාමී කාලසීමාවේ වාර්තා කළ රු. මිලියන 10,221 ට සාපේක්ෂව සියයට 62.4 ක වර්ධනයකි. එමෙන්ම, විදුලි ගාස්තු සහ අනෙකුත් ද්‍රව්‍ය පිරිවැය ඉහළ යාමත් සමඟ සලකා බලන කාලසීමාව තුළ විකුණුම් පිරිවැය රු. මිලියන 9,211 ක් දක්වා සියයට 50 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පසුගිය වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 4,081 ක දළ ලාභයට සාපේක්ෂව 2023 මුල් මාස හතර තුළ රු. මිලියන 7,386 ක දළ ලාභයක් වාර්තා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2022 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා කළ රු. මිලියන 483 ක අලාභයට සාපේක්ෂව 2023 වසරේ අනුගාමී කාලසීමාව තුළ රු. මිලියන 2,778 ක ලාභයක් ලබා ඇත. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2022 වසරේ පළමු මාස හතර තුළදී නිෂ්පාදනය කර ඇති ජලය ඝන මීටර මිලියන 275 ට සාපේක්ෂව 2023 වසරේ අනුගාමී කාලසීමාව තුළ

ජලය ඝන මීටර මිලියන 263 ක් නිෂ්පාදනය කර ඇත. එසේම නව ගාස්තු ක්‍රියාත්මක කිරීම සඳහා දක්වන ලද පාරිභෝගික ප්‍රතිචාර හේතුවෙන් සමාලෝචිත කාල සීමාව තුළ ජල අලෙවිය ඝන මීටර මිලියන 196 ක් වූ අතර 2022 වසරේ එම කාලය තුළ ජල අලෙවිය ඝන මීටර මිලියන 210 කි.

තවද, ආදායම් නොලබන ජලය පෙර වසරට වඩා වැඩිවීමක් පෙන්නුම් කළ අතර, පෙර වසර තුළදී සියයට 24.0 ක් වූ එම අගය සමාලෝචිත කාල සීමාව තුළදී සියයට 25.4 ක් ලෙස වාර්තා විය.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

පසුගිය වසර කිහිපය පුරාවටම කොළඹ වරාය සිය උපරිම ක්‍රියාකාරී ධාරිතාවය කරා ළඟා වන තෙක්ම එහි මෙහෙයුම්හි ක්‍රමිකව වැඩිවීමක් දක්නට ලැබුණි. බටහිර බහාලුම් පර්යන්තයේ සංවර්ධන කටයුතු කඩිනමින් නිම කිරීම සහ නැගෙනහිර බහාලුම් පර්යන්තය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීම මෙහිලා ඉතා තීරණාත්මක වේ.

රටෙහි ප්‍රධාන වරාය සැලැස්මට අනුකූලව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ඇති අතර නැගෙනහිර බහාලුම් පර්යන්තය අදියර - II, බටහිර බහාලුම් පර්යන්තය අදියර - I සහ අදියර - II ඇතුළු වෙනත් ව්‍යාපෘති මෙයට අන්තර්ගත වේ. මෙම ව්‍යාපෘති 2030 වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. නැගෙනහිර බහාලුම් පර්යන්තයෙහි ගැඹුර වැඩිකිරීමත් සමඟ විශාල නෞකා වරායට පැමිණීමෙහි වැඩි විභවතාවක් පවතී. පර්යන්තයෙහි ඉතිරි සංවර්ධන ක්‍රියාවලිය රු. බිලියන 5.9 ක ආයෝජනයක් සහිතව වේගවත් කර ඇත. බහාලුම් ප්‍රවාහනය සඳහා විස්සේ සම ඒකක නැව්ගත කළ හැකි යාත්‍රා 775 කට වඩා වැඩි සංචිතයක් සහිත, වරාය අධිකාරිය සමඟ වසර දහයකට වැඩි සහයෝගී වාණිජ සබඳතාවක් ඇති ලොව විශාලතම නැව් සමාගමක් වන MSC සමාගම නැගෙනහිර බහාලුම් පර්යන්තයෙහි මෙහෙයුම් ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ වරාය ශ්‍රී ලංකා වරාය අධිකාරියට වැඩි ආදායමක් උපයනු ඇති අතර ජාත්‍යන්තර නාවික ප්‍රජාව කොළඹ වරාය කෙරෙහි තබා ඇති විශ්වසනීයත්වය ශක්තිමත් කරනු ඇත.

2023 පළමු මාස හතර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු ආදායම රු. මිලියන 26,795 ක් වන අතර එයින් සියයට 36 ක ඉහළම ආදායම වන රු. මිලියන 9,936 ක් නැව් භාණ්ඩ වාහක කටයුතු වලින් ද, සියයට 24 ක ආදායම වන රු. මිලියන 6,424 ක් නාවික කටයුතු වලින් ද, සියයට 9 ක ආදායම වන රු. මිලියන 2,484 ක් වාප්පු මෙහෙයුම් වලින්ද සමන්විත වේ. 2022 වසරේ පළමු මාස හතර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දළ ලාභය වූ රු. මිලියන 14,221 ට සාපේක්ෂව 2023 වසරේ එම කාලසීමාව තුළදී වරාය අධිකාරියේ දළ ලාභය රු. මිලියන 11,485 ක් වී ඇත.

## ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් භාණ්ඩ මෙහෙයුම් මත වැඩි දියුණු කළ ධාරිතාවකින් යුතු පහසුකම් සැලසීමේ අංශය ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) විසින් මෙහෙයවනු ලැබේ. මෙය නව ආනයන ගුවන් භාණ්ඩ ගොඩනැගිල්ලක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත එක් කෙරෙන හයවන ගුවන් භාණ්ඩ මෙහෙයුම් පර්යන්තය වනු ඇත. දැනට පවතින ආනයන පර්යන්ත පහසුකම අපනයන මෙහෙයුම් සඳහා උපක්‍රමශීලීව මාරු කිරීම මගින් සමස්ත ධාරිතාව මෙට්‍රික් ටොන් 250,000 සිට මෙට්‍රික් ටොන් 400,000 දක්වා වැඩි වීමේ ප්‍රතිලාභ පාරිභෝගිකයින්ට ලැබෙනු ඇත.

බිම් හැසිරවීම, ගුවන් තොටුපොළක තීරණාත්මක ක්‍රියාකාරකමක් වන අතර එය ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා සම්බන්ධීකාරකයක් ලෙස ක්‍රියා කරයි. එය ගුවන් තොටුපලේ කාර්යක්ෂමතාව සහ සුමට ක්‍රියාකාරිත්වය කළමනාකරණය කරයි. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ආශ්‍රිතව ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් බිම් හැසිරවීමේ සේවාව ආරම්භ කරන ලද්දේ පැමිණෙන මගීන් සමඟ අභ්‍යන්තර ගුවන් සේවා සඳහා එහි බිම් හැසිරවීමේ සේවා සැපයීම මඟිනි. ජාත්‍යන්තර ගුවන් ගමන් මෙහෙයුම් සඳහා බිම් හැසිරවීමේ සේවා සැපයීමේ අභිප්‍රාය ඇතිව, ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් තවත් සුවිශේෂී ඓතිහාසික අවස්ථාවක් සනිටුහන් කරමින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි සමාගම සතු බිම් හැසිරවීමේ සේවා පුහුණු ඇණියක් දියත් කරන ලදී. 2022 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළදී වාර්තා කළ රු. මිලියන 6,407 ක අලාභයට සාපේක්ෂව 2023 වසරේ පළමු මාස හතර තුළ ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම රු. මිලියන 11,624 ක ලාභයක් වාර්තා කර ඇත.

වගුව **3.1** : රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්වල ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර |
|---|---|
| **රාජ්‍ය බැංකු: (ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව)** | ▪ ණය කළඹේ සමස්ථ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ සුපරීක්ෂණය සහ නැවත අයකරගැනීම වර්ධනය කිරීම<br>▪ කාලීන නියාමන අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීම, අත්‍යාවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සහ පාරදෘශ්‍ය වාර්තාකරණ භාවිතයන් පවත්වාගෙන යාම.<br>▪ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, පාරිභෝගික සේවා මට්ටම ඉහළ නැංවීම හා නවීන ඩිජිටල් තාක්ෂණ හා අනුගතවීම.<br>▪ පවත්නා ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව ක්‍රම සංවර්ධනය කිරීම.<br>▪ වරප්‍රසාද නොලත් ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබාදීම පුළුල් කිරීම හා මූල්‍ය ප්‍රචලිත කිරීම හා මූල්‍යමය සමෝදායනය ප්‍රචලිත කිරීම. |
| **ශ්‍රී ලන්කන් ගුවන් සමාගම** | ▪ ශ්‍රී ලංකාවේ අන්තර්කාලීන විදේශ ණය ප්‍රතිපත්තිය හේතුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 175ක ජාත්‍යන්තර බැඳුම්කර පොලී ගෙවීම රඳවා තබා ඇත.<br>▪ ශ්‍රීලන්කන් ගුවන් සමාගම  සහ එහි අනුබද්ධිත ආයතන ප්‍රමුඛතා පදනම මත බැහැර කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. |
| **ලංකා විදුලිබල මණ්ඩලය** | ▪ 2023 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසාන පාරිභෝගික විදුලි ගාස්තු සාමාන්‍යය සියයට 66 කින් වැඩි කරන ලදී.<br>▪ මෙගාවොට් 10ට අඩු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා විචල්‍ය ප්‍රමිතිගත ගාස්තු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.<br>▪ සංවර්ධන සහයෝගීතා ආයතන සමඟ සාකච්ඡා කර විදුලිබල අංශයට අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. |
| **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව** | ▪ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බෙදාහැරීම් නියෝජිතයන් හරහා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත සමාගම් දෙකක් සමඟ රජය ගිවිසුම් අත්සන් කර ඇත.<br>▪ වාහන සඳහා QR කෝටාව වැඩි කිරීම. |
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | ▪ නාවික, ස්ටීව්ඩෝරිං, වරාය මෙහෙයුම්, බහාලුම් මෙහෙයුම්, සාම්ප්‍රදායික භාණ්ඩ මෙහෙයුම් ආදියෙහි තීරුබදු ව්‍යුහය සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br>▪ කොළඹ වරායේ දකුණු ආසියානු ලොජිස්ටික් මධ්‍යස්ථානයේ ආයෝජනය සඳහා අනුමැතිය. |
| **ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම** | ▪ කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයට (Flight Information Region)  ඉහළින් පියාසර කරන ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා අය කරන ගුවන් ගමන් සංතරණ ගාස්තු සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දීම. |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## වගුව 3.2 : ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි ලාභදායිත්වය

(රු. මිලියන)

| | රාජ්‍ය ව්‍යාපාරය | 2021 | 2022 (අ) | 2023.04.30 (අ) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 43,190 | 30,977 | 3,386 |
| 2 | මහජන බැංකුව | 30,387 | 21,338 | 6,281 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 28,555 | 4,510 | 1,997* |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 405 | -48 | -426 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 878 | 377 | -115 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 776 | 1,823 | -781 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 33,159 | 43,428 | 21,080 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 11,725 | 12,476 | 4,458 |
| 9 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 5,936 | 8,010 | 4,591 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 334 | 1,884 | 76* |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 1,780 | 2,651 | 324 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -34,139 | -261,869 | -29,797 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -81,816 | -615,053 | 43,429 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 25,601 | 57,026 | 11,485 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | -3,054 | -3,064 | 2,778 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | -755 | 6,434 | 11,624 |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම (අ) | -166,370 | -72,177 | 60,228* |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | -3,054 | 484 | 217 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,597 | -940 | -291 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 48 | 69 | 98 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 96 | 27 | 52 |
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | 329 | -471 | -345 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 160 | 133 | -77 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -232 | 17 | -27 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -490 | -18 | -10 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 468 | 511 | 169 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 511 | 514 | 190 |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | -3 | 380 | -3 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | -20 | 2 | 0.3* |
| 30 | සිමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 1,387 | 6,160 | 589 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (අ) | 117 | 74 | 29 |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම (අ) | 8 | 70 | 28 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,953 | 3,267 | 1,035 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,004 | 1,390 | 424 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,239 | 1,586 | 960 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | -14 | 14 | -1 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතගත සංස්ථාව | 3,157 | 1,240 | -4 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | -258 | -2,033 | 193 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -344 | -370 | 3 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -227 | -541 | -168 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 11 | -236 | -27 |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | -35 | -53 | -4 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,136 | 315 | 60 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (අ) | 60 | 473 | 27 |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -880 | -615 | -71 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -281 | -380 | 750 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -64 | -42 | 6 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -136 | -38 | 11* |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 0.5 | 115 | 142 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 234 | 61 | 16 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -976 | -633 | -350 |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | 1,256 | 6,086 | -5 |
| **එකතුව** | | **-97,845** | **-744,658** | **144,224** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

* *2023.03.31* දිනට

*(අ)* කෙටුම්පත්

වගුව 3.3 : රාජ්‍ය ව්‍යාපාර වෙතින් ලද අයබදු/ ලාභාංශ ආදායම (රු. මිලියන)

| | 2021 | 2022 | 2023.04.30 |
|---|---|---|---|
| අයබදු | **25,919** | **22,004** | **7,535** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 3,500 | – | – |
| ලංකා බැංකුව | 1,500 | – | – |
| මහජන බැංකුව | 1,977 | 441 | – |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 8,500 | 13,200 | 2,000 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | – | – |
| රාජ්‍ය දැව සංස්ථාව | 100 | 320 | – |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 100 | 100 | – |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 1,824 | 1,608 | 225 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2,000 | 1,000 | – |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 15 | 35 | 40 |
| ලංකා විදුලිබල මණ්ඩලය | – | – | – |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | – | 416 | – |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 900 | 361 | 1,000 |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | – | – | – |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | 10 | – |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 25 | 50 | – |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | – | – | – |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 25 | – | – |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | – | – |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 50 | 1,000 | 1,000 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | – | 350 | – |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 110 | 290 | 150 |
| ශ්‍රී ලංකා විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | - | 1,200 | 3,000 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | 10 | 70 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | - | – | – |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | – | – | – |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | – | 1,015 | – |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 147 | 400 | – |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 4,000 | – | – |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 1,100 | – | – |
| සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 25 | 50 | – |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 16 | 33 | – |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 5 | – | – |
| කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | - | 90 | – |
| වෙනත් රාජ්‍ය ව්‍යාපාර | - | 25 | 50 |
| ලාභාංශ | **4,672** | **6,087** | **2,030** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 30 |
| ලංකා බැංකුව | 346 | 346 | 173 |
| මහජන බැංකුව | 316 | 316 | 158 |
| සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව | 1 | 0.9 | - |
| කොමර්ෂල් බැංකුව | – | 0.17 | - |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 899 | 1511 | - |
| සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම | - | 500 | 500 |
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | 700 | 759 | - |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 20 | 20 | 20 |
| සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | - | 0 | - |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 3 | 13 | - |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | - | 0 | 25 |
| සීමාසහිත මාන්තායි සෝල්ට් සමාගම | 15 | 0 | 20 |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 29 | 15 | - |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | - | 10 | - |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | 3 | 50 | 5 |
| සී/ස රජයේ වාණිජ නීතිගත සංස්ථාව | - | 11 | - |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 1331 | 1805 | - |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 345 | 313 | - |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | 327 | 218 | 436 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 0 | 86 |
| සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | - | - | - |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 95 | 24 | 119 |
| සීමාසහිත ලංකා සීනි සමාගම | - | - | 352 |
| සීමාසහිත ලංකා ලොජිස්ටික් සමාගම | - | - | - |
| වැවිලි සමාගම් | 98 | 95 | 97 |
| සීමාසහිත ලංකා ත්‍රිපෝෂ සමාගම | – | 10 | 10 |
| වෙනත් | 2 | 10 | - |
| එකතුව | **30,591** | **28,091** | **9,565** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# 4 වන පරිච්ඡේදය

# විදේශ මූල්‍යයනය

## සමාලෝචනය

2022 අප්‍රේල් මාසයේදී රජය විසින් අනුගමනය කරන ලද, බලපෑමට ලක්වූ ණය සේවාකරණය තාවකාලිකව නතර කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන්, රජයේ ණය ගැනීමේ වැඩසටහනේ ක්‍රියාකාරීත්වයට බලපෑම් ඇතිකරනු ලැබීය. ඒ අනුව, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල උපයෝජනය සඳහා බොහෝ සාම්ප්‍රදායික ද්විපාර්ශ්වික ණයහිමියන්ගෙන් ලද විදේශ ප්‍රතිලබ්ධි ලබාදීම් සහ නව විදේශ මූල්‍යයනය එකඟතා 2023 පළමු කාර්තුවේදී අඩුවිය. බහුපාර්ශ්වික ණයහිමියන් සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකළ අතර, සංවර්ධන ව්‍යාපෘති සඳහා බහුපාර්ශ්වික ණයහිමියන්ගෙන් ලද ඇතැම් මූල්‍ය පහසුකම්වලින් කොටසක් රජයේ අයවැය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා යොදාගන්නා ලදී.

තවද, රජයේ අයවැය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද විස්තීරණ අරමුදල් පහසුකම - 2023-2026 යටතේ එ.ජ. ඩොලර් 333 ක පළමු ණය වාරිකය, ශ්‍රී ලංකා රජය වෙත මෙම වර්ෂයේ මුල් කාර්තුව තුළ ලැබිණි. ඊට සමගාමීව, අවදානම් කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණ ජාලය තුළින් සහාය වීම හා විස්තීර්ණ අරමුදල් පහසුකම මඟින් යෝජනා කරන ලද ප්‍රතිපත්තිමය මුලපිරීම් ශක්තිමත් කිරීම සඳහා, බහුපාර්ශ්වික ණයහිමියන් වෙතින් සැලකිය යුතු ප්‍රතිපත්තිමය විදේශ මූල්‍යයන ප්‍රමාණයක් ලබා ගැනීම මෙම වසර තුළදී ආරම්භ කර ඉදිරියට ක්‍රියාත්මක කිරීමට රජය අපේක්ෂා කරයි.

තවද, 2022 වර්ෂයේදී ඉන්දීය රජයෙන් ලද හදිසි ණය මාලාව යටතේ 2023 වර්ෂයේදී ලද ප්‍රතිලබ්ධීන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වූ විදේශ මූල්‍යයන අවශ්‍යතා සැලකිය යුතු ලෙස සපුරා ගැනීමට උපකාර වූ අතර, ඒ යටතේ 2023 ප්‍රථම කාර්තුවේදී එ.ජ. ඩොලර් මිලියන 131.0ක් ලබාගැනීමට හැකිවිය.

ඒ අනුව, සමාලෝචිත කාල සීමාව තුළ එ.ජ. ඩොලර් මිලියන 670.3 ක විදේශ මූල්‍යකරණ ප්‍රමාණයක් ලබාගැනීමට රජයට හැකිවිය.

## විදේශ මූල්‍යයන එකඟතා

2023 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා, ජපන් රජය සමඟ පූර්ණ ප්‍රදාන ගිවිසුම් දෙකකට එළැඹීමෙන් රජය නිල සංවර්ධන ආධාර ලෙස එ.ජ. ඩොලර් මිලියන 40.9 ක් ලබාගෙන ඇත. මෙම ප්‍රදාන එකඟතා, ජපානයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ඉන්ධන සඳහා ලබාදුන් එ.ජ. ඩොලර් මිලියන 37.1 ක ප්‍රදානයකින් සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් වෛද්‍ය හෝ සායනික අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් එ.ජ. ඩොලර් මිලියන 3.8 ක පහසුකමකින් සමන්විත වේ. මෙම පූර්ණ ප්‍රදාන සෞඛ්‍ය සහ සමාජ සුබසාධන ක්ෂේත්‍රය වෙනුවෙන් ලැබී ඇත.

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2023 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා, ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 670.3 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් එ.ජ.ඩොලර් මිලියන 333.0 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද පළමු ණය වාරිකය ලෙසද ඉතිරිය අනෙකුත් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, එ.ජ.ඩොලර් මිලියන 4.3 ක් පූර්ණ ප්‍රදාන වශයෙන් ලද ප්‍රතිලබ්ධි ද වේ.

2023 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබාගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 50 ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් පිළිවෙලින් ඉන්දියාව (සියයට 21), ලෝක බැංකුව (සියයට 18) සහ ආසියානු සංවර්ධන බැංකුව (සියයට 9) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

වගුව 4.1: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2023 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු කරන ලද ප්‍රතිලබ්ධි


| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (එ.ජ.ඩොලර් මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්වීපාර්ශ්වික** | **146.4** | **1.3** | **147.7** |
| ඉන්දියාව | 142.5 | - | 142.5 |
| නෙදර්ලන්තය | 3.9 | - | 3.9 |
| ජර්මනිය | - | 1.3 | 1.3 |
| **බහුපාර්ශ්වික** | **519.6** | **3.0** | **522.6** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 333.0 | - | 333.0 |
| ලෝක බැංකුව | 114.2 | 3.0 | 117.2 |
| ආසියානු සංවර්ධන බැංකුව | 58.0 | - | 58.0 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 11.1 | - | 11.1 |
| ඔපෙක් අරමුදල | 3.2 | - | 3.2 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 0.1 | - | 0.1 |
| **එකතුව** | **666.0** | **4.3** | **670.3** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් බවට හැරවීමේදී 2023 අප්‍රේල් 28 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.

* තාවකාලික අගයයන්

රූපසටහන 4.1: 2023 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි - ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජ.ඩොලර් මිලියන)




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව


** වෙනත් - අධ්‍යාපනය හා පුහුණු, ආරක්ෂක, විද්‍යාව සහ තාක්ෂණය, වාරිමාර්ග, පරිසරය, මානුෂීය ආධාර, ආපදා කළමනාකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන, ඉඩම් සංවර්ධනය, සහ වැවිලි කර්මාන්ත

## එකඟතා පළකරන ලදුව සංවර්ධන ව්‍යාපෘතිවල ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2023 අප්‍රේල් 30 දින වන විට එ.ජ. ඩොලර් බිලියන 6.3 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ජපානය, ආසියානු සංවර්ධන බැංකුව, ඉන්දියාව, සහ ලෝක බැංකුව විසින් ලබා දීමට නියමිතය.

එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 21 ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ දළ සියයට 18 ක ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 12 ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.


**රූප සටහන 4.2: 2023 අප්‍රේල් 30 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (එ.ජ.ඩොලර් මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

*වෙනත් = ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, හංගේරියාව, කුවේට්, පාකිස්ථානය, කොරියාව, රුසියාව, ජර්මනිය, ඩෙන්මාර්කය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, යුරෝපීය ආයෝජන බැංකුව, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල

**රූප සටහන 4.3: 2023 අප්‍රේල් 30 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජ.ඩොලර් මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2023 අප්‍රේල් 30 වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 36.3[1] කි.

2023 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] එ.ජ.ඩොලර් මිලියන 470.2 කි. මෙයින්, එ.ජ.ඩොලර් මිලියන 378.4 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන එ.ජ.ඩොලර් මිලියන 91.8 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 අප්‍රේල් 12 දින සිට 2023 අප්‍රේල් අවසානය දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 3,691 ක්ද, පොලී ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,301* ක්ද විය.

1 තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.

2 ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම
* ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියා සමඟ සැසඳීමට යටත්වේ.